# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1401— 2005 ජූලි මස 08 වැනි සිකුරාදා— 2005.07.08

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ජෙදය - පළකිරීම්

### විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**
ජනාධිපති ලේකම් කාර්යාලය
**සංඛ්‍යාලේඛනඥ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛනඥ තනතුර සඳහා සුදුස්සන් තෝරා ගැනීමේ තරඟ විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනයේ අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර "විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව", පැලවත්ත, බත්තරමුල්ල වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම් පස උඩ කෙළවරේ සංඛ්‍යාලේඛනඥ තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය.

(අ) *දේශීය ඉල්ලුම් පත්‍ර.*– අයදුම්පත් කැඳවන අවසාන දිනය 2005.08.10 දින වේ.

(ආ) *විදේශීය ඉල්ලුම් පත්‍ර.*– අයදුම්පත් කැඳවන අවසාන දිනය 2005.08.17 දින වේ.

2005 නොවැම්බර් මස විභාගය පැවැත්වීමට නියමිතය.

*සටහන.*– ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින් ම විඳ දරා ගත යුතුය.

(02) *සේවා කොන්දේසි.*– මෙම තනතුර ස්ථිරය. දායක විශ්‍රාම වැටුප් අරමුදල යටතේ දායක විශ්‍රාම වැටුපකට හිමිකම් ඇත.

*ව්‍යතිරේකය*

2003.01.01 දිනට පෙර විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දැරූ අයකු මෙම තනතුරට බඳවා ගනු ලැබුවහොත් එවැනි අයකුට තවදුරටත් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුපක් සඳහා හිමිකම් ඇති අතර, වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(03) *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.*– ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 10-12 දක්වා උපවගන්ති අදාල වේ.

(04) *වැටුප් පරිමාණය.*– වර්ෂයකට රු. 1,57,500 - 15 x 3,780 –2,14,200 වැටුපක් හිමි වේ. (T B 5-1-2 වැටුප් ක්‍රමය)

4.1 තනතුරට පත්වූ දින සිට 04 වැනි වැටුප් පියවර එළඹීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතුය. (රා. පරි. චක්‍රලේඛ 20/2001 හා 2001.09.12 පරිදි)

4.2 වයස පදනම් කරගෙන කාර්යක්ෂමතා කඩඉමෙන් ඔබ්බට නිදහස් කරනු නොලැබේ.

4.3 නියමිත කාලය තුළදී කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වීමට නොහැකි වීම ඉන්පසුව යෙදෙන වේතනාධිකය විලම්භනය කිරීමට හේතු වේ.

05. *වයස් සීමාව.*– අවුරුදු 18-45 අතර වේ. (දැනටමත් රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයට මෙම උපරිම වයස් සීමාව අදාල නොවේ.)

06. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්.*–

6.1 ශ්‍රී ලාංකිකයකු විය යුතුය.

6.2 විශිෂ්ඨ චරිතයකින් හා ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට යෝග්‍ය මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුයි.

6.3 පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් ලබා තිබිය යුතුය. :

6.3.1 සංඛ්‍යානය, ගණිතය, ආර්ථික විද්‍යාව, ප්‍රජා විද්‍යාව, භූගෝල විද්‍යාව, පරිගණක විද්‍යාව, තොරතුරු තාක්ෂණය හෝ සමාජ විද්‍යාව යන එක් විෂයකින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලැබූ පන්ති සාමාර්ථයක් සහිත විශේෂ උපාධියක් ;

හෝ

6.3.2 ඉහත 6.3.1 හි සඳහන් විෂයන් වලින් එක් විෂයක් ඇතුළුව පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලැබූ සාමාන්‍ය උපාධියක් හෝ විශේෂ උපාධියක් සහ එම විෂයන් අතරින් එකකින් ලැබූ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ;

හෝ

6.3.3 ප්‍රධාන විෂයයන් තුනෙන් එකක් සංඛ්‍යානය හෝ ගණිතය හෝ ආර්ථික විද්‍යාව හෝ පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය විෂයයක් සහිතව පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලැබූ පන්ති සාමාර්ථයක් සහිත සාමාන්‍ය උපාධියක්

07. *බඳවා ගැනීමේ ක්‍රමය.*– සංඛ්‍යාලේඛනඥ තනතුරේ පවතින පුරප්පාඩු සංඛ්‍යාවෙන් 80%ක් අභ්‍යන්තර බඳවා ගැනීමේ මගින් හා ඉතිරි 20% බාහිරව බඳවා ගනු ලැබේ.

*ශ්‍රී ලංකා ජනරජයේ ගැසට්පත්‍රයේ* නිවේදනයක් මගින් සහ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවා විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන තරඟ විභාගයෙන් ප්‍රශ්න පත්‍ර දෙකෙන් ම සමත් (සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්ණ පත්‍රයෙන් 40%ක් අවම ලකුණු ලබාගත යුතුය.) වන හා විභාගයෙන් ඉහලම ලකුණු ලබා ගන්නා අය සහනික පත් පරීක්ෂා කිරීමට පමණක් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව බඳවා ගැනීම් කරනු ලැබේ.

තරඟ විභාගයේ විෂය නිර්දේශය හා විභාග පරිපාටිය :

විෂය නිර්දේශය

1 වැනි ප්‍රශ්න පත්‍රය – අභියෝග්‍යතාව

සංඛ්‍යාමය හැකියාවන්, ගැටළු නිරාකරණය, තර්කන ශක්තිය, සමාන්‍ය බුද්ධිය ආදිය මැනෙන අයුරින් සැකසෙන විෂයානු බද්ධ ප්‍රශ්න වලින් යුතු පැය 01ක ප්‍රශ්න පත්‍රයකි. මුළු ලකුණු ගණන 100.

2 වැනි ප්‍රශ්න පත්‍රය - සමාන්‍ය දැනීම

පහත සඳහන් විෂයානුබද්ධව සකස් කෙරෙන පැය 01ක ප්‍රශ්ණ පත්‍රයකි. මුළු ලකුණු ගණන 100.

(i) දේශීය ජාත්‍යන්තර සංඛ්‍යාලේඛන
(ii) සංඛ්‍යාලේඛන හා ප්‍රජා සංවර්ධනය
(iii) සංඛ්‍යාලේඛන සම්බන්ධිත නව ප්‍රවණතා
(iv) සමාජ ආර්ථික තොරතුරු
(v) පරිසරය හා සමාජය
(vi) භූගෝලීය සාධක හා ප්‍රජාව
(vii) තොරතුරු තාක්ෂණය

08. *ලිඛිත තරඟ විභාගය.*–

(i) මෙම තරඟ විභාගය සිංහල, දෙමළ, හා ඉංග්‍රීසි මාධ්‍ය වලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයින්ට තමන් කැමති භාෂා මාධ්‍යයකින් පිළිතුරු සැපයිය හැක. ප්‍රශ්න පත්‍ර 2 කටම එකම මාධ්‍යයෙන් පිළිතුරු සැපයිය යුතුය.

(ii) දිවයිනේ ඕනෑම තැපැල් කාර්යාලයකින් ගෙවා ලබාගත් රු. 200ක් වටිනා "විභාග කොමසාරිස් ජනරාල්" නමින් ලියූ මුදල් කුවිතාන්සියක් නොගැලවෙන සේ ඉල්ලුම් පත්‍රයේ අදාල කොටුවේ ඇලවිය යුතුය. මුදල් කුවිතාන්සියේ ඡායාප්ඨ පිටපතක් ලහ තබා ගැනීම යෝග්‍ය වේ.

(iii) විභාගය සඳහා ගෙවන ල ද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු නොලැබේ.

(iv) මෙම විභාගය කොළඹ හා යාපනයේදී පමණක් පැවැත්වේ. විභාගය පවත්වනු ලබන දිනය පසුව දැනුම් දෙනු ලැබේ.

(v) ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අයවලුන්ම විභාගයට ඉල්ලා ඇතැයි උපකල්පනය කරමින් සියළුම ඉල්ලුම්කරුවන්ට ප්‍රවේශ පත් නිකුත් කරනු ලැබේ. අයදුම්කරුවන් විභාගයෙන් සමත් වූවත් සම්මුඛ පරීක්ෂණයේදී සහනික පත් පරීක්ෂා කොට බලා අවම සුදුසුකම් නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vi) ඉල්ලුම්පත්‍රය සෙ. මී 22-29 A4 කඩදාසියේ සකස් කළ යුතු අතර, 1-7 දක්වා විස්තර පළමු පිටුවට ද, 8-13 තෙක් ශ්‍රීර්ෂ 2 වැනි පිටුවට ද ඉතිරිය 3 වැනි පිටුවට ද ඇතුළත් විය යුතුය. ආදර්ශ ඉල්ලුම් පත්‍රය මේ සමග ඇත.

(vii) ඉල්ලුම් පත් ලැබුණු බවට දන්වනු නොලබන අතර, විභාගය සඳහා අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කල වහාම පුවත්පත් වල නිවේදනයක් පළ කරනු ඇත.

(viii) අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ix) විභාගය කල් දැමීම හෝ අවලංගු කිරීමේ බලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

(x) විභාග දිනට දින 07කට කලින් ප්‍රවේශ පත්‍ර නොලැබුවහොත් අයදුම්කරුවන් පහත සඳහන් විස්තර විභාග කොමසාරිස් ජනරාල් වෙත දන්වමින් ප්‍රවේශ පත්‍රයක් ඉල්ලා සිටිය යුතුය. (විදුලි පණිවුඩ විභාග - කොළඹ) (සංඛ්‍යාලේඛනඥ තනතුර)

(අ) අයදුම්කරුගේ සම්පූර්ණ නම
(ආ) ලිපිනය
(ඇ) ඉල්ලුම්පත් තැපැල් කළ දිනය, ලියාපදිංචි කළ අංකය හා තැපැල් කාර්යාලය
(ඈ) මුදල් ගෙවූ තැපැල් කාර්යාලය, දිනය හා ලදුපත් අංකය

09. *අපේක්ෂකයාගේ අනන්‍යතාවය.*– විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ ප්‍රවේශ පත්‍රය විභාග අවස්ථාවේදී අයදුම්කරු ළඟ තබා ගත යුතු අතර, නිරීක්ෂක විසින් ඉල්ලා සිටි විටෙක ඔහුට ලබා දිය යුතුය. විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් සෑම අපේක්ෂකයෙකුම විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලේඛන වලින් එකක් ඉදිරිපත් කිරීම සෑහේ :

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රයක්
(ඇ) පෝස්ට් මාස්ටර් ජනරාල් විසින් නිකුත් කරන ලද වලංගු හැඳුනුම්පතක්

10. ලිඛිත පරීක්ෂණයෙන් තෝරා ගනු ලබන අපේක්ෂකයන් සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කිරීමට සූදානම් ව තබා ගත යුතු ය.

(අ) උප්පැන්න සහතිකය
(ආ) උපාධි හා අනෙකුත් අදාල අධ්‍යාපන සහතික වල මුල් පිටපත් හා පිටපත් ද සමග ඉදිරිපත් කළ යුතුය. (අදාල විෂයයන් පිළිබඳ විශ්ව විද්‍යාල වලින් ලබාගත් ලිපිඳ ඇතුළුව)
(ඇ) චරිත සහතික 02ක් (මින් එකක් විශ්ව විද්‍යාලයිය ආචාර්යවරයෙකු හෝ මහාචාර්යවරයෙකුගෙන් විය යුතුය.)
(ඈ) වෘත්තිය සුදුසුකම් පිළිබඳ සහතික (ඇතොත්)
(ඉ) සිංහල/දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් සමත් උසස් ම විභාග පිළිබඳ සහතික

*සැලකිය යුතුයි.*–(අ) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතුයි.

(ආ) ඉල්ලූ අවස්ථාවකදි ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

(11) රාජ්‍ය සේවයේ/පලාත් රාජ්‍ය සේවයේ/රාජ්‍ය සංස්ථා වල සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තමන්ගේ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් අයදුම්පත් එවිය යුතුය.

(12) අයදුම්පත් හෝ ඒ සම්බන්ධිත අනෙකුත් ලියකියවිලි සියල්ලක් ම විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල්වරයාට හැර මෙම දෙපාර්තමේන්තුවේ වෙනත් කිසිම නිලධාරියෙකුගේ නමට පෞද්ගලිකව නොඑවිය යුතුය.

(13) මෙමගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) වැනි ජේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරු වලට පත් කිරීම සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි වලට අවධානය යොමු කරනු ලැබේ. (පොදු කොන්දේසි වල 8 ජේදයේ සඳහන් කරුණු හැර)

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,
ඩබ්. ජේ. එස්. කරුණාරත්න,
ජනාධිපති ලේකම්.

2005 ජූනි මස 22 වැනි දින,
ජනාධිපති ලේකම් කාර්යාලය,
කොළඹ 01.

*ආදර්ශ අයදුම්පත්‍රය*

***ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛනඥ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය***

විභාග අංකය : ☐
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහායි)

විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත මාධ්‍ය ☐
(සිංහල S දෙමළ T ඉංග්‍රීසි E)
(අදාල ඉංග්‍රීසි අක්ෂරය කොටුව තුළ ලියන්න)

විභාගය සඳහා තෝරා ගත් නගරය

| | | |
|---|---|---|
| කොළඹ | 1 | |
| යාපනය | 2 | |

(අදාල කොටුව තුල ✓ යොදන්න)

01. (අ) අයදුම්කරුගේ මුලකුරු සමග අගට යෙදෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) උදා : Mr. / Mrs. / Miss

Mr. S I L V A S A

(ආ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :

(ඇ) සම්පූර්ණ නම සිංහලෙන්/දෙමළෙන් : .....
.....

02. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

03. ස්ථිර ලිපිනය (විභාග ප්‍රවේශ පත්‍ර තැපැල් කල යුතු) :

(අ) ඉංග්‍රීසි කැපිටල් අකුරින් :

(ආ) සිංහලෙන්/දෙමළෙන් :.....
.....

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2005 ජූලි මස 15 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2005 ජූලි මස 01 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

2005 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

**ලක්ෂමන් ගුණවර්ධන**
*වැඩ බලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.*


රජයේ මුද්‍රණාලයාධිපති විසින් ප්‍රකාශ කරන ලදී.

04. ස්ත්‍රී/පුරුෂ භාවය (අදාල හිස් කොටුව තුල ✓යොදන්න) :

| | | |
|---|---|---|
| පුරුෂ | 1 | |
| ස්ත්‍රී | 2 | |

05. උපන්දිනය, (නිත්‍ය වර්ෂයක්, මාසයක්, දිනයක් ඇතුලත් කරන්න) :

| අවු. | මාස | දින |
|---|---|---|
| | | |

| | අවු. | මාස | දින |
|---|---|---|---|
| 2005.08.10 දිනට වයස (මෙරට) | | | |
| 2005.08.17 දිනට වයස (විදේශීය) | | | |

06. ජන වර්ගය (අදාල කොටුවේ ✓ යොදන්න)

| | | | | | |
|---|---|---|---|---|---|
| සිංහල | 1 | | ඉන්දියානු දෙමළ | 4 | |
| ශ්‍රී ලංකා දෙමළ | 2 | | මැලේ | 5 | |
| මුස්ලිම් | 3 | | වෙනත් | 6 | |

07. ශ්‍රී ලංකා පුරවැසිභාවය : (අදාල කොටුවේ ✓යොදන්න)

| | | |
|---|---|---|
| පරම්පරාවෙන් | 1 | |
| ලියාපදිංචිවීමෙන් | 2 | |

08. පදිංචි දිස්ත්‍රික්කය : ———— ;
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :———— ;

09. ගෙවන ලද ගාස්තුව :

1. මුදල් ගෙවන ලද දිනය ;
2. තැපැල් කාර්යාලය ;
3. ලදුපත් අංකය ;
4. මුදල ;

කුවිතාන්සිය නොගැලෙවෙනසේ මෙහි අලවන්න.
කුවිතාන්සියේ ඡායාස්ථ පිටපතක් අයදුම්කරු ළඟ තබා ගන්නේ නම් මැනවි.

10. එක් එක් භාෂා විෂයයෙන් ලබා ඇති ඉහළම සාමාර්ථය :
(විභාගයේ නම සඳහන් කරන්න)

| | |
|---|---|
| 1. සිංහල | |
| 2. දෙමළ | |
| 3. ඉංග්‍රීසි | |

11. අධ්‍යාපන සුදුසුකම් : (උපාධිය හෝ ඊට ඉහළ)

| අනු අංකය | ආයතනය | සිට | දක්වා | උපාධිය/ ඩිප්ලෝමාව | පන්තිය | විෂයයන් |
|---|---|---|---|---|---|---|
| 1 | | | | | | |
| 2 | | | | | | |
| 3 | | | | | | |

12. දැනට නිරත රැකියාව හා ඊට ප්‍රථමයෙන් කරන ලද රැකියාවන් (රැකියාවට බැඳුනු දිනය, ඉන් අස්වූ දිනය, අන්තිමට ලැබුණු වාර්ෂික වේතනය සඳහන් කරන්න.)

| අනු අංකය | ආයතනය | තනතුර | සිට | දක්වා | වාර්ෂික වැටුප (රුපියල්) |
|---|---|---|---|---|---|
| 1 | | | | | |
| 2 | | | | | |
| 3 | | | | | |

13. විශේෂ සුදුසුකම් :

14. ඔබ සාපරාධී වරදකට උසාවියකදී චෝදනා ලැබුවෙක් ද? එසේ නම් දිනය සහ නඩු අංක සමග සම්පූර්ණ විස්තර සඳහන් කරන්න.

මෙම ඉල්ලුම්පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත්, නිවැරදි වූත්, ඒවා බවට මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරු වලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සකු වීමට යටත් බවත්, පත් කිරීමෙන් පසුව ඒ බව දැනගතහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් බවත්, දැන සිටිමි.

———————————
අයදුම්කරුගේ අත්සන.

දිනය :———— ;

**අයදුම්කරුගේ අත්සන සහතික කිරීම**

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ..... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා බවත්, මා ඉදිරියේදී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත්, සහතික කරමි.

———————————————;
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————;
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————————;
තනතුර :————————————;
ලිපිනය :———————————— ;

අයදුම්කරු රජයේ දෙපාර්තමේන්තුවක/ආයතනයක සේවය කරන්නේ නම් පහත සඳහන් සහතිකය සමග සිය දෙපාර්තමේන්තුවේ හෝ ආයතන හා ප්‍රධානියාගේ මාර්ගයෙන් අයදුම්පත ඉදිරිපත් කළ යුතුය.

**දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මෙම අයදුම්කරු ඉහත සඳහන් ජේදවල සපයා ඇති තොරතුරු නිවැරදි බවත්, ඔහුගේ/ඇයගේ හැසිරීම හා වැඩ සතුටුදායක වූ බවත්, අදාල ගැසට් නිවේදනයෙහි ප්‍රකාර ඔහු/ඇය මේ විභාගයට පෙනී සිටීමේ සුදුසුකම් සපුරා ඇති බවත්, මෙයින් සහතික කරමි.

තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් මුදා හැරිය හැකිය/නොහැකිය.

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන

නම :———————————— ;
තනතුර :———————————— ;
ලිපිනය :———————————— ;
දිනය :———————————— ;
(නිල මුද්‍රාව)

07-196

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

## ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ශ්‍රී ලංකා දුම්රිය සේවයට රේල් පීලි (20 Meters - EN45EI ) 8,000ක් සැපයීම සඳහා වූ ටෙන්ඩරය

ටෙන්ඩර් අංකය: (SRS/F.6415).

ශ්‍රී ලංකා දුම්රිය සේවයට රේල් පීලි (20 Meters - EN45EI) 8,000ක් සැපයීම සඳහා කොළඹ 10, ඩී. ආර්. විජේවර්ධන මාවතේ, අංක 01, ප්‍රවාහන අමාත්‍යාංශයේ, අමාත්‍ය මණ්ඩල ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත්, නිෂ්පාදකයින්ගෙන් හා /හෝ සැපයුම්කරුවන්ගෙන් භාරගනු ලැබේ. නිෂ්පාදකයින්ට, ඔවුන්ගේ මිල ගණන් ඔවුන් විසින් බලය පවරන ලද නියෝජිතයෙකු මාර්ගයෙන් ද ඉදිරිපත් කළ හැක.

02. ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවත, දරන ලිපිනයේ පිහිටි දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලය වෙත හෝ පිටරටවල පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාල වෙත 2005.07.13 දින ප. ව. 3.00 වන තෙක් ආපසු නොගෙවනු ලබන රු. 10,000ක ටෙන්ඩර් ගාස්තු මුදලක් ගෙවා ලබා ගන්නා ලද ආකෘති මත ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

03. Rails නිෂ්පාදනය, ISO 9001: 2000 සහතික ලත් හෝ ඒ හා සමාන ජාත්‍යන්තර තත්ත්ව කළමණාකරණ ක්‍රමයක් සහිත ආයතන විසින් කළ යුතුය.

04. ටෙන්ඩර්පත් භාර ගන්නා අවසාන දිනය 2005.08.15 වැනි දින ප. ව. 2.00 වේ. මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත් පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ අතින් ගෙනවිත් භාරදීම හෝ කළ හැකිය.

සභාපති, අමාත්‍ය මණ්ඩල ටෙන්ඩර් මණ්ඩලය, ප්‍රවාහන අමාත්‍යාංශය, අංක 01, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.

ලියාපදිංචි තැපැලේ දී සිදුවන තැපැල් ප්‍රමාදයන් සඳහා ප්‍රවාහන අමාත්‍යාංශය හෝ දුම්රිය දෙපාර්තමේන්තුව වගකීම භාරගනු නොලැබේ.

05. ටෙන්ඩර් පත් විවෘත කිරීම, ටෙන්ඩර්පත් භාර ගැනීම අවසන් වූ විගස ඉහත ජේද අංක 4 හි සඳහන් ලිපිනයේ දී සිදු කෙරේ. ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවට ටෙන්ඩර්කරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයාට සහභාගිවීමට අවසර දෙනු ලැබේ.

06. ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කට් මාවතේ පිහිටි දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේදී ටෙන්ඩර්පත් අය කිරීමකින් තොරව පරීක්ෂා කළ හැකිය.

07. වැඩි විස්තර සඳහා, දුම්රිය ගබඩා අධිකාරි, දුම්රිය ගබඩා උප දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1347, ඕල්කට් මාවත, කොළඹ 10.

දුරකථන අංක 2432044 හෝ 2436818 අමතන්න.

සභාපති,
අමාත්‍ය මණ්ඩල ටෙන්ඩර් මණ්ඩලය,
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

07-292

## බඩු බාහිරාදිය විකිණීම්

**මහෙස්ත්‍රාත් අධිකරණය - පොළොන්නරුව**

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් හිමිකම් නොකියන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම.

01. පොළොන්නරුව මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාලව රාජසන්තක කරනු ලැබූ හා මෙතෙක් හිමිකම් නොකියන ලද හා කල් තබා ගැනීමේදී විනාශ වී යා හැකි භාණ්ඩ 2005 අගෝස්තු 27 වන දින පෙ. ව. 9.30 ට එම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් වන කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම් පාන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු අතර, ඒ පිළිබඳව සලකා බැලීම සඳහා අදාළ භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කරනු ලැබේ.

03. අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැ. 1 1/2 කට පෙර වෙන්දේසියේ නියමිත භාණ්ඩ මහජනතාවට පරීක්ෂා කර බැලිය හැකිය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර දැමීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ භාර ගැනීමේදී හා මුදල් ගෙවීමේදී තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු අතර, භාණ්ඩ මිලදී ගැනීමට එන සෑම අයෙකුම තම ජාතික හැඳුනුම්පත ගෙන එම අනිවාර්යය වේ.

06. භාණ්ඩ මිලදී ගැනීම මුදලින් කළයුතු අතර, මිලදී ගන්නා භාණ්ඩ වෙන්දේසිය පවත්වන දිනයේදී ප. ව. 6.00 ට පෙර අධිකරණය භූමියෙන් ඉවත් කර ගත යුතුය.

දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්.

2005 ජුනි 13 වන දින,
පොළොන්නරුව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**උපලේඛනය**

| | | | |
|---|---|---|---|
| 01. | ඒ. ආර්. 1541/04 | - | පා පැදි 03 යි. |
| 02. | ඒ. ආර්. 1841/04 | - | අංක අපැහැදිළි පාපැදි 01 යි. |
| 03. | ඒ. ආර්. 766/04 | - | පාපැදි අංක 57160467 පා පැදි 01 යි. |
| 04. | අංක නැත | - | අබලන් පා පැදි 01 යි. |
| 05. | ඒ. ආර්. 1693/03 | - | අංක අපැහැදිළි පා පැදි 01 යි. |
| 06. | ඒ. ආර්. 901/04 | - | 0358520 පා පැදි 01 යි. |
| 07. | ඒ. ආර්. 425/04 | - | ඩී. එම්. 1034 පා පැදි 01 යි. |
| 08. | ඒ. ආර්. 123/04 | - | ඒසී 4010028 පා පැදි 01 යි. |
| 09. | ඒ. ආර්. 1019/04 | - | ඒ 7777බී පා පැදි 01 යි. |
| 10. | 51623 | - | (එ ෆ්ටී 2036) (ජේඕ 118067) පා පැදි 02 යි. |
| 11. | 1171/03 | - | අංක අපැහැදිළි පා පැදි 01 යි. |
| 12. | 2936 | - | බී. 373059 පා පැදි 01 යි. |
| 13. | 77432 | - | ඊ 491065 පා පැදි 01 යි. |
| 14. | 86028 | - | 30098 පා පැදි 01 යි. |
| 15. | බී. 2526/02 | - | අංක අපැහැදිළි පා පැදි 02 යි. |
| 16. | 4111 | - | පී 6933 පා පැදි 01 යි. |
| 17. | 4112 | - | ඒ 421550 පා පැදි 01 යි. |
| 18. | 4113 | - | අංක අපැහැදිළි පා පැදි 01 යි. |
| 19. | අංක නැත | - | අබලන් පා පැදි 01 යි. |
| 20. | අංක නැත | - | අබලන් පා පැදි 01 යි. |
| 21. | 7112 | - | උදළු 01 යි, සවල් 01 යි. |
| 22. | 13370 | - | සවල් 02 යි. |
| 23. | 7113 | - | සවල් 01 යි. |
| 24. | 13371 | - | සවල් 01 යි, |
| 25. | 15568 | - | සවල් 01 යි. |
| 26. | 6939 | - | සවල් 01 යි. උදළු 01 යි |
| 27. | 1414 | - | සවල් 02 යි. |
| 28. | 16427 | - | සවල් 02 යි |
| 29. | 14933 | – | සවල් 02 යි |
| 30. | ඒ. ආර්. 1437/04 | - | සවල් 03 යි. |
| 31. | ඒ. ආර්. 1436/04 | - | සවල් 02 යි. |
| 32. | 6939 | - | සවල් 03 යි, උදළු 01 යි. |
| 33. | 11540 | - | සවල් 01 යි |
| 34. | 6926 | - | උදළු 01 යි, සවල් 01 යි. |
| 35. | 99362 | - | සවල් 02 යි. |
| 36. | 99363 | - | සවල් 02 යි. |
| 37. | 15728 | - | සවල් 02 යි. |
| 38. | 92144 | - | සවල් 02 යි. |
| 39. | 92145 | - | සවල් 02 යි. |
| 40. | අංක නැත | - | උදළු 02 යි. |
| 41. | අංක නැත | - | වී අදින උදළු 02 යි. |
| 42. | 96895 | - | උදළු 01 යි. |
| 43. | අංක නැත | - | උදළු 01 යි. |
| 44. | අංක නැත | - | උදළු 02 යි. |
| 45. | අංක නැත | - | උදළු 01 යි. |
| 46. | 6939 | - | උදළු 01 යි. |
| 47. | 6925 | - | උදළු 01 යි. |
| 48. | 6927 | - | උදළු 02 යි. |
| 49. | ඒ. ආර්. 1335/04 | - | උදළු 01 යි. |
| 50. | ඒ. ආර්. 1351/04 | - | උදළු 01 යි. |
| 51. | 13594 | - | උදළු 01 යි, ඉල්ලංකුරු 01 යි. |
| 52. | 11817 | - | බාල්දි 02 යි. |
| 53. | 99994 | - | බාල්දි 01 යි. |
| 54. | අංක නැත | - | කියත් 01 යි. |
| 55. | අංක නැත | - | කියත් 01 යි. |
| 56. | අංක නැත | - | කියත් 01 යි. |
| 57. | අංක නැත | - | කියත් 01 යි. |
| 58. | අංක නැත | - | කියත් 01 යි. |
| 59. | අංක නැත | - | කියත් 01 යි. |
| 60. | 99574 | - | කියත් 02 යි. |
| 61. | ඒ. ආර්. 875/04 | - | කියත් 01 යි. |
| 62. | 86432 | - | පොරෝ 01 යි, පිහිය 01 යි. |
| 63. | 13993 | - | කියත් 02 යි. |
| 64. | ඒ. ආර්. 148/04 | - | කියත් 01 යි. |
| 65. | 2231 | - | කියත් 01 යි. |
| 66. | 75954 | - | කියත් 01 යි. |
| 67. | 74163 | - | කියත් 01 යි. |
| 68. | 68808 | - | කියත් 01 යි. |
| 69. | 93670 | - | කියත් 01 යි. |
| 70. | 13043 | - | කියත් 01 යි. |
| 71. | 2841 | - | කියත් 02 යි. |
| 72. | අංක නැත | - | කියත් 02 යි. |
| 73. | 12880 | - | කියත් 01 යි. |
| 74. | අංක අපැහැදිළි | - | කියත් 01 යි. |
| 75. | 96796 | - | කියත් 01 යි. |
| 76. | බී. 424/01 | - | කියත් 01 යි. |
| 77. | 99003 | - | පොරෝ 03 යි. |
| 78. | 80364 | - | පොරොව 02 යි. |
| 79. | 11508 | - | පොරොව 01 යි. |
| 80. | 98450 | - | පොරෝව 01 යි. |
| 81. | අංක නැත | - | තැටි නොමැති තරාදි විසි පහයි පඩි සමඟ |
| 82. | අංක නැත | - | තරාදි 01 යි. |
| 83. | බී. 3438/04 | - | කියත් 01 යි. |
| 84. | අංක නැත | - | කියත් 01 යි. |
| 85. | අංක නැත | - | කියත් 01 යි. |
| 86. | අංක නැත | - | කියත් 01 යි. |
| 87. | 86482 | - | කියත් 01 යි. |
| 88. | අංක නැත | - | කියත් 01 යි. |
| 89. | අංක නැත | - | කියත් 01 යි. |
| 90. | අංක නැත | - | කියත් 01 යි. |
| 91. | අංක නැත | - | කියත් 01 යි. |
| 92. | 75954 | - | කියත් 01 යි. |
| 93. | අංක නැත | - | කියත් 01 යි. |
| 94. | අංක නැත | - | කියත් 01 යි. |
| 95. | අංක නැත | - | කියත් 01 යි. |
| 96. | අංක නැත | - | කියත් 01 යි. |
| 97. | 99811 | - | කියත් 02 යි, අත් කියත් 01 යි, යතු කැට 01 යි, වරක්කල් 01යි, අතකොලු 01 යි. |
| 98. | 4281 | - | කියත් 01 යි, අතකොලු 01 යි. |
| 99. | අංක නැත | - | කියත් 01 යි, රාස්කු 01 යි. |
| 100. | අංක නැත | - | යතු කැට 01 යි, වරක්කල් 01 යි. කියත් 01 අතකොළු 01යි |
| 101. | 2199/01 | - | බහල් 02යි, ඇම්ප් 01 යි |
| 102. | 18575 | - | සමරු පළහනා හැත්තෑ පහයි. (75යි) |
| 103. | 22430 | - | 108103 දරන විලියස් වර්ගයේ වතුර මෝටරය |
| 104. | අංක නැත | - | ජැක් පොට් යන්ත්‍ර දෙකක කොටස් |
| 105. | බී. 2562/02 | - | තාච්චි 01 යි. |
| 106. | අංක නැත | - | පීඩන ලාම්පු 02 යි. |
| 107. | 98650 | - | ඇළුමිනියම් කල 01 යි, ඇළුමිනියම් මුට්ටි |

01 යි.
108. අංක නැත - ඇළුමිනියම් මුට්ටි 01 යි.
109. ඒ. ආර්. 2030 - හෙල්මට් 02 යි
110. 13705 - විල්බැරෝ 01 යි.
111. ඒ. ආර්. 1162/04 - වඩු බංකු 01 යි
112. ඒ. ආර්. 926/04 - ඇල්කටීන් බට 30 යි
113. 92040 - 109 - 0465 යතුරු පැදිය
114. බී. 1410/98 - 94 ශ්‍රී 1733 යතුරු පැදිය.
115. 64968 - 26 ශ්‍රී 7585 එල්ipප් වර්ගයේ ලොරිය
116. හිස් බෝතල් හා බුලි තොගයක්
117. තඹ දහර තොගයක්

07-192

---

**මහාධිකරණය - මහනුවර**

අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ ද්‍රව්‍ය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මහනුවර මහාධිකරණයේ නඩුවලට අදාළ රාජසන්තක කරනු ලැබූ හා මෙතෙක් හිමිකම් නොකියන ලද සහ නඩු අවසන් නොවූ, එහෙත් විනාශ වෙමින් පවතින පහත සඳහන් ද්‍රව්‍යයන් 2005.07.30 වැනි දින පෙ. ව. 9.30 ට මෙම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

(2) මෙහි සඳහන් වන කිසිදු ද්‍රව්‍යයක් පිළිබඳ හිමිකම් කියන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට පෙර හිමිකම් ඉදිරිපත් කළ යුතුය.

(3) රෙජිස්ට්‍රාර්වරයාගේ අනුමැතිය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2කට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත ද්‍රව්‍යයන් මහජනයාට පරීක්ෂාකර බැලිය හැක.

(4) අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත්කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

(5) වෙන්දේසියේ දී මිලදී ගනු ලබන ද්‍රව්‍යයන් සඳහා ඒ වේලාවේ ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් එම ද්‍රව්‍යයන් ඉවත් කර ගත යුතුය. සියලුම ගෙවීම් මුදලින් කළ යුතු අතර, චෙක්පත් භාරගනු නොලැබේ.

(6) වෙන්දේසියේ භාණ්ඩ මිලදී ගැනීමට පැමිණෙන සෑම පුද්ගලයෙක් ම තම පෞද්ගලික හැඳුනුම්පත රැගෙන ආ යුතුය.

පළාත් බද මහාධිකරණ විනිසුරු,
මහනුවර.

2005.06.15 වැනි දින,
මහනුවර මහාධිකරණයේ දී ය.

**උපලේඛනය**

*නඩු අංකය*

| | | |
|---|---|---|
| 01. | 32658 | අංක රහිත අබලන් පා පැදිය |
| 02. | 51655 | ලුමාලා වර්ගයේ පා පැදිය |
| 03. | එච්. සී. 5813 | ලගේජ් එක සහිත පා පැදිය |
| 04. | 22499 | අංක 8635108 දරන පා පැදිය |
| 05. | 16533 | අංක එප් එප් 35121 දරන අබලන් පා පැදිය |
| 06. | 81428 | එන් 2268 දරන අබලන් පා පැදිය |
| 07. | 3467 | ඒ. එස්. 01867 දරන අබලන් පා පැදිය |
| 08. | 4071 | රජ්සුපර් වර්ගයේ පා පැදිය |
| 09. | 81428 | 75 බී 718 දරන අබලන් පා පැදිය |
| 10. | ජූරි 1626/95 | අංක රහිත පා පැදිය |
| 11. | අංක රහිත | හොණ්ඩා වර්ගයේ අබලන් යතුරු පැදිය |

07-170

---

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

**ඇටෝර්නි බලය අවලංගු කිරීම**

නුගේගොඩ, ජම්බුගස්මුල්ල මාවත, 5 වන ලේන්, අංක 23/12 හි පදිංචි, රන්කොත්ගෙදර බෝධිජේනගේ සෝමා ස්වර්ණලතා වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සියඵම සාමාජිකයින් වෙත දන්වා සිටින වගනම්

නුගේගොඩ ජම්බුගස්මුල්ල මාවත 5 වන ලේන්, අංක 23/12 හි පදිංචි දිලානි ක්‍රිෂාන්ති රන්කොත්ගෙදර යන අය වෙත ප්‍රසිද්ධ නොතාරිස් සී. එස්. හෙට්ටිආරච්චි මහතා විසින් සහතික කරන ලද අංක 1530 සහ 1992.07.24 දින යටතේ ඇටෝර්නි බලය පවරමින් සකස් කරන ලද ඇටෝර්නි බලපත්‍රය අද දින සිට අවලංගු කළ බවත්, ඇය විසින් මා වෙනුවෙන් කරනු ලබන කිසිදු ක්‍රියාකාරකමකට හෝ ගනුදෙනුවකට වග නොකියන බවත්, ශ්‍රී ලංකාවේ ජනරජයේ ජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

ආර්. සෝමා ස්වර්ණලතා.

07-190

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව**

ණය අංකය : 0900000574.

ණයකරුගේ සම්පූර්ණ නම : නාකඵුඵගමුව යාපාගේ හේමචන්ද්‍ර

(මෙහි මින් මතු "එකී පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2005.05.06 වැනි දින අංක 1,392 දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ සහ වර්ෂ 2005.05.21 වැනි දින "ලක්බිම", "ද අයිලන්ඩ්", "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස පහත විස්තර කර තිබෙන දේපළ මාතර, කුරුඳුවත්ත, වල්ගම හි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන ජී. පී. ආනන්ද මයා විසින් 2005.07.28 වැනි දින පෙ. ව. 11.00 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

(1) එකී දේපළ උකස මත සංස්ථාවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ අනූපන්දහස් පනස් හතයි ශත තිස්අටක (රු. 1,95,057.38) මුදල ද, 2003.10.31 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් තිස්හත්දහස් හයසිය පනස් හතයි ශත අනූ එකක් (රු. 37,657.91) ද, වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ තිස් දෙදහස් හත්සිය පහළොවයි ශත විසි නවයක් (රු. 2,32,715.29)ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ අනූපන්දහස් පනස් හතයි ශත තිස්අටක (රු. 1,95,057.38) මුදල මත අයවිය යුතු වර්ෂයකට 13.90%ක්ගෙන් වන පොළියක් 2003.11.01 වැනි දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

**උපලේඛනය**

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, නැගෙනහිර ගිරුවා පත්තුවේ, අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ හීන්ඔුන්න ග්‍රාමනිලධාරී කොට්ඨාශයේ, හීන්ඔුන්න ග්‍රාමයේ හි පිහිටි කෝන්ගහයාය නමැති ඉඩමට 1973.11.15 දින මිනුම්පති විසින් මැන සාදන ලද එස්.වී. ජී. 248 (පිටු අංක 10) පිඹුර ප්‍රකාර ලොට් 331 ට මායිම්, උතුරට : මාර්ග රක්ෂිතය සඳහා වෙන්කර ඇති කැබලි අංක 316 සහ කැබැලි අංක 332 ඉඩම ද ; නැගෙනහිරට : කැබැලි අංක 332, 333 සහ 330 ද ; දකුණට : කැබැලි අංක 329 සහ 330 ද ; බටහිරට : කැබැලි අංක 328 ද යන (මායිම් තුළ පිහිටි) අක්කර එකයි රූඩ් එකයි පර්චස් විසිදෙකයි (අ1, රූ. 01, පර්. 22) වසසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද, මාර්ග පරවශතාවය ද සමඟ හම්බන්තොට ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හම් 37/644/85 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

වර්ෂ 2005ක් වූ ජූනි මස 22 වැනි දින කොළඹ දී ය.

සාමාන්‍යාධිකාරී.

07-277

---

**ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව**

ණය අංකය : 0700000524.

ණයකරුගේ සම්පූර්ණ නම : ප්‍රසන්න උයඳ කුමාර සිටුගේ

(මෙහි මින් මතු "එකී පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2003.08.22 වැනි දින අංක 1303 දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ සහ වර්ෂ 2004.12.04 වැනි දින "ලක්බිම", "ද අයිලන්ඩ්", "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස පහත විස්තර කර තිබෙන දේපළ මාතර, කුරුඳුවත්ත, වල්ගම හි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන ජී. පී. ආනන්ද මයා විසින් 2005.07.26 වැනි දින පෙ. ව. 10.00 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

(1) එකී දේපළ උකස මත සංස්ථාවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් අනූහතර දහස් අටසිය අසූඅටයි ශත තිස්අටක(රු. 94,888.38) මුදල ද, 2002.06.30 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් පනස් එක්දහස් නවසිය තිස් හතරයි ශත හැට හයක් (රු. 51,934.66) ද, වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ හතලිස් හයදහස් අටසිය විසිතුනයි ශත හතරක් (රු. 1,46,823.04) ද,

(2) එකී රුපියල් අනූහතර දහස් අටසිය අසූඅටයි ශත තිස්අටක (රු. 94,888.38) මුදල ද, මත අයවිය යුතු වර්ෂයකට 17% බැගින් වන පොළියක් 2002.07.01 වැනි දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

**උපලේඛනය**

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතරෙහි, උළුවිටිකේ අංක 3/1 ගැමුණු මාවතේ පිහිටි කහටගහවත්ත නොහොත් කැටකැලගහවත්ත නැමැති ඉඩමට 1994.10.17 දින ඩී. වීරසේකර මානක තැන විසින් සාදන ලද අංක 3381 දරන පිඹුරේ සඳහන් කැබැලි අංක 1ඒ කැබැල්ලට මායිම් උතුරට: මෙම ඉඩමේ ම කොටසක් වන දැන් ලකුණුකොට ඇති අංක 1 බී ද ; නැගෙනහිරට : මෙම ඉඩමේම ඉතිරි කොටසක් වන අංක 1 බී ද; දකුණට : කැටකැලගහවත්ත නොහොත් මෙම යතරබස්වත්ත ද ; බස්නාහිරට : හල්ගහකුඹුර නොහොත් පිටකොරවුව සහ දැන් ප්‍රාදේශීය සභා පාරට ලකුණු කොට ඇති 1 සී කැබැල්ල යන මායිම් තුළ පිහිටි පර්චස් පහළොවයි දශම පහක(අක්.0, රූ. 00, පර්. 15.5) වපසරියකින් යුතු වූ ඉඩම මෙයට මාර්ග පරවශතාවය ද සමඟ ගාල්ල ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ඒ 490/113 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

වර්ෂ 2005ක් වූ ජූනි මස 23 වැනි දින කොළඹ දී ය.

සාමාන්‍යාධිකාරී.

07-276

---

**ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව**

ණය අංකය : 0800000873.

ණයකරුගේ සම්පූර්ණ නම : හෙට්ටිගමගේ කරුණාසේන

(මෙහි මින් මතු "එකී පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2004.09.03 වැනි දින අංක 1,357 දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ සහ වර්ෂ 2005.11.04 වැනි දින "ලක්බිම", "ද අයිලන්ඩ්", "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස පහත විස්තර කර තිබෙන දේපළ, මාතර, කුරුඳුවත්ත, වල්ගම හි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන ජී. පී. ආනන්ද මයා විසින් 2005.07.27 වැනි දින පෙ. ව. 10.00 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

(1) එකී දේපළ උකස මත සංස්ථාවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ අසූඅට දහස් තිස් දෙකයි ශත අසූවක (රු. 1,88,032.80) මුදල ද, 2004.01.31 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් තිස්දහස් පන්සිය තිස්එකයි ශත හැත්තෑ හතක් (රු. 30,531.77) වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ දහඅට දහස් තුන්සිය අසූ හතරයි ශත පනස් හතක් (රු. 2,18,384.57) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ අසූඅට දහස් තිස් දෙකයි ශත අසූවක (රු. 1,88,032.80) මුදල, මත අයවිය යුතු වර්ෂයකට 13.9% බැගින් වන පොළියක් 2004.02.01 වැනි දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

**උපලේඛනය**

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වෙලබොඩ පත්තුවේ, ගංදර ප්‍රාදේශීය සභා සීමාවේ, ගංදර ග්‍රාමයෙහි පිහිටි ලොට් එප් 03 බක්මී කුඹුර හෙවත් බක්මීගහ කොරටුවහි කොටසක් සහ කොළඹරාල පදිංචි උනහපුළුව වත්ත ද ලොට් සී කොළඹරාල පදිංචි උනහපුළුව වත්ත නමැති ඉඩමට 2000.03.08 දින එස්. කේ. පී. සිල්වා මානක තැන විසින් මැන සම්පාදිත අංක 917 පිඹුර ප්‍රකාර ලොට් 05ඒ ට මායිම් උතුරට : ලොට් 06 සහ ගංදර මහා විද්‍යාලයට අයත් ක්‍රීඩා පිටිය ද ; නැගෙනහිරට : මද්දුමරාලගේ කොරටුව ද ; දකුණට : ලොට් 05 සී ද ; නිරිතට : ප්‍රසිද්ධ පාර ලොට් 05 බී ද ; බටහිරට : පිඹුරු අංක 588 හි ලොට් ඒ ද (පාර ) යන මායිම් තුළ පිහිටි පර්චස් දහතුනයි දශම පහක (අක්.0, රූ.0, පර්. 13.5) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලුදේද මාර්ග පරවශතාවය ද සමඟ මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙ බී 557/202 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

වර්ෂ 2005ක් වූ ජූනි මස 23 වැනි දින කොළඹ දී ය.

සාමාන්‍යාධිකාරී.

07-285

---

**රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව**

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 6/31008/ටී6/448 සහ 6/33289/ජී6/018.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2005.04.01 දින ගැසට් පත්‍රයේ සහ 2005.05.26 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යටෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, පන්නිපිටිය, හයිලෙවල් පාර, අංක 145 හි බලයලත් වෙන්දේසිකාර එම්. සමරනායක මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2005.09.03 වැනි දින පෙරවරු 9.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

කඵතර දිස්ත්‍රික්කයේ, අලුත්ගම පිහිටි වල්ගම්කැලේ නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු සී. වික්‍රමගේ විසින් සැකැසුණු 1996.10.04 දින හා අංක 2610 දරන පිඹුරෙ කැබැලි අංක 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ.0, රූ.2, පර්. 6ක් වූ දේපළ හා ඒ මත පිහිටි සියලුම දේත් සමඟ වේ. මෙම ඉඩම් කොටස පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 87/251 යටතේ ලියාපදිංචි කොට ඇත.

තවද අංක 2610 දරන පිඹුරෙන් හිමි මාර්ග අයිතිය ද සමඟ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
වැඩ බලන සාමාන්‍යාධිකාරී.

2005 ජූනි මස 24 වැනි දින,
ගාලු පාරේ, අංක 269,
කොළඹ 3.

07-291/6

---

**රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව**

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 1/37712/සීඩී4/784.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2004.01.30 දින ගැසට් පත්‍රයේ සහ 2005.03.04 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යටෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, පන්නිපිටිය, හයිලෙවල් පාර, අංක 145 හි බලයලත් වෙන්දේසිකාර එම්. සමරනායක මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2005.09.03 වැනි දින පෙරවරු 9.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

කොළඹ දිස්ත්‍රික්කයේ, කොටිකාවත්ත – මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාව තුළ, කුඩා බුත්ගමුව, කුඩා බුත්ගමුව පාර, අංක 87/26ඒ හි පිහිටි බෙලිගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එස්. ඩී. ලියනසූරිය විසින් 'මැන සාදන ලද 1991.11.03 දින හා අංක 5229 දරන මිනුම් පිඹුරේ කැබැලි අංක ඒ ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ.0, රූ. 0, පර්. 8.85 ක් වූ බෙදා වෙන්කරන ලද බිම් කොටස හා ඒ මත පිහිටි සියලුම දේත් සමඟ වේ. මෙම ඉඩම් කොටස කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 611/280 යටතේ ලියාපදිංචි කොට ඇත.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
වැඩ බලන සාමාන්‍යාධිකාරී.

2005 ජූනි මස 24 වැනි දින,
ගාලු පාරේ, අංක 269,
කොළඹ 3.

07-291/5

---

**රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව**

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 1/25495/සීබී7/899 සහ 1/34220සීඩී3/060.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2000.09.22 දින ගැසට් පත්‍රයේ සහ 2001.01.12 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යටෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, පන්නිපිටිය, හයිලෙවල් පාර, අංක 145 හි බලයලත් වෙන්දේසිකාර එම්. සමරනායක මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2005.09.03 වැනි දින පෙරවරු 10.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය සභා සීමාවේ, කොට්ටාව බොරැල්ල පාරේ ( අරලිය උයන පාර), දෙපානම ග්‍රාමයේ සහ පොල්වත්ත හි පිහිටි පොල්වත්ත කැලේවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් සැකසුණු 1993.07.02 දින හා අංක 6065 ඒ දරන පිඹුරේ කැබලි අංක 199 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 11.4 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස හා ඒ මත පිහිටි සියලුම දේත් සමඟ වේ. මෙම ඉඩම් කොටස කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2028/264 යටතේ ලියාපදිංචි කොට ඇත.

තවද, එකී අංක 6065 ඒ දරන පිඹුරේ කැබැලි අංක 297, 298 සහ 291 යන කැබලි මතින් දැක්වෙන මාර්ග අයිතිය ද සමඟ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩ බලන සාමාන්‍යාධිකාරී.*

2005 ජූනි මස 24 වැනි දින,
ගාලු පාරේ, අංක 269,
කොළඹ 3.
07-291/4

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 6/29122/ඩබ්6/823.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2001.01.19 දින *ගැසට් පත්‍රයේ* සහ 2001.04.17 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපල හා භූමිය, පන්නිපිටිය, හයිලෙවල් පාර, අංක 145 හි බලයලත් වෙන්දේසිකාර එම්. සමරනායක මහතා විසින් එම දේපල පිහිටි ස්ථානයේ දී 2005.09.03 වැනි දින ප. ව. 2.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර ලියාපදිංචි කිරීමේ කොට්ඨාශයේ, හොරණ නගර සභා සීමාවන් තුළ හොරණ පිහිටි සොරණවත්ත (දැන් රෝයල් ගාඩන්ස් ලෙස හඳුන්වෙන ) ඉඩමේ බලයලත් මිනින්දෝරු බී. ඒ. සී. ජයසුරිය විසින් සැකැසුණු 1994. නොවැම්බර් 20.21, 25 සහ 26 දිනයන් හා අංක 1520 දරන පිඹුරේ කැබැලි අංක 2/31 ලෙස දැක්වෙන ප්‍රමාණයේන අ. 0, රූ. 0, පර්. 13.1ක් වූ දේපල හා ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ. මෙම ඉඩම් කොටස පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 150/116 යටතේ ලියාපදිංචි කොට ඇත.

තවද අංක 1520 දරන පිඹුරේ කැබලි අංක 2/71 සහ 2/76 මතින් ඇති මාර්ග අයිතිය ද සමග වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩ බලන සාමාන්‍යාධිකාරී.*

2005 ජූනි මස 24 වැනි දින,
ගාලු පාරේ, අංක 269,
කොළඹ 3.
07-291/3

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0502300018.

ණයකරුගේ සම්පූර්ණ නම : විජයවංශ කිත්සිරි බණ්ඩාරගේ ධර්මසිරි විජේබණ්ඩාර.

(මෙහි මින් මතු "එකී පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2003.01.28 වැනි දින අංක 1378 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2005.02.10 වැනි දින "ලක්බිම", "ද අයිලන්ඩ්", "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකරගැනීම පිණිස පහත විස්තර කර තිබෙන දේපල මහනුවර, හීරස්සගල, මවුන්ට් ප්‍රසන්ට් ගාඩන්ස්, අංක 432/1, යන ස්ථානයේ පදිංචි බලයලත් වෙන්දේසිකරු වන අයි. ඩබ්ලිව්. ජයසූරිය මයා විසින් 2005.07.29 වැනි දින පෙ. ව. 10.30 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

(1) එකී දේපළ උකස මත සංස්ථාවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ තිස්දහස් එකසිය එකක් (රු. 1,30,101.21) ද,

(2) එකී රුපියල් හැත්තෑපන්දහසක (රු. 75,000) මුදල මත අයවිය යුතු වර්ෂයකට 17%සහ 6.00% බැගින් වන පොළියක් 2002.09.01 වැනි දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකරගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

### දේපළ පිළිබඳ විස්තරය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මීගොඩ කෝරළේ, මහගල්බඩ වැවුදවිල්ල හත්පත්තුවේ මාරළු වාව පිහිටි ගොරකොටයාවත්ත, පරණගෙදරවත්ත සහ මැදවත්ත දැනට මැදවත්ත ලෙස හඳුන්වන ඉඩමට වර්ෂ 1996.10.15 දින එස්. වී. ගුණසේකර මාතක තැන සැදූ 5839 ඒ දරන පිඹුර ප්‍රකාර ලොට් 2 ඒ ට මායිම්, උතුරට:ඒ. එම්. අබේරත්නට අයිති ඉඩම සහ එස්. එච්. ටිකිරි බණ්ඩාරගේ ඉඩම ද; නැගෙනහිරට : ලොට් 3 ද ; දකුණට : ලොට් 2 බී සහ බස්නාහිරට : ප්‍රාදේශීය සභා පාර ද යන මායිම් තුල පිහිටි පර්චස් හතක (අක්.0,රූ. 0, පර්. 7) විශාල බිම වේ. මෙය කැබලි 8 හි මාර්ග අයිතිය ද සමඟ කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 1336/236 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2005ක් වූ ජූනි මස 23 වැනි දින කොළඹ දී ය.
ඉහත නම සඳහන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.
සාමාන්‍යාධිකාරී.

07-278

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0400001138.

ණයකරුගේ සම්පූර්ණ නම : හිරියාලගම්මන පොල්වත්තේ ගෙදර වසන්ත ලාල් රාජපක්ෂ.

(මෙහි මින් මතු "එකී පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2003.04.04 වැනි දින අංක 1283 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2003.04.05 වැනි දින "දිනමිණ", "ද අයිලන්ඩ්", "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකරගැනීම පිණිස පහත විස්තර කර තිබෙන දේපළ මහනුවර, හීරස්සගල, මවුන්ට් ප්‍රසන්ට් ගාඩන්ස්, අංක 432/1, යන ස්ථානයේ බලයලත් වෙන්දේසිකරු වන අයි. ඩබ්ලිව්. ජයසූරිය මයා විසින් 2005.07.29 වැනි දින ප. ව. 2.30 ට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

(1) එකී දේපළ උකස මත සංස්ථාවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හැත්තෑපන්දහසක (රු. 75,000) මුදල ද, 2002.08.31 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් පනස් පන්දහස් එකසිය එකයි ශත විසි එකක් (රු. 55,101.21) ද, වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ තිස්දහස් එකසිය එකයි ශත විසිඑකක් (රු. 1,30,101.21) ද,

(2) එකී රුපියල් හැත්තෑපන්දහසක (රු. 75,000) මුදල මත අයවිය යුතු වර්ෂයකට 17%සහ 6.00% බැගින් වන පොළියක් 2002.09.01 වැනි දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකරගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

### දේපළ පිළිබඳ විස්තරය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුවේ කුළුගම්මනසිය පත්තුවේ, හාරිස්පත්තුව ආදායම් නිලධාරි කොට්ඨාශයේ යහලතැන්නහි පිහිටි යහලතැන්නවත්ත නමැති ඉඩමට මිනුම්පති විසින් අඳින ලද මු. පී. මහ 3466 දරන පිඹුර ප්‍රකාර ලොට් 105 දරන ඉඩමට මායිම් උතුරට : ලොට් 103 හා 180 ද ; නැගෙනහිරට: ලොට් 180 හා 119 ද ; දකුණට : ලොට් 119 හා 128 ද ; බස්නාහිරට : ලොට් 128 හා 104 හා 103 ද යන මායිම් තුල පිහිටා ඇති හෙක්ටයාර් බිත්තුවයි දශම එකයි පහයි හතරක් (0.154 හෙක්.) වපසරියකින් යුක්ත ඉඩම හා ඊට අයත් සියලුදේ ද මහනුවර ඉඩම් කාර්යාලයේ එල්. ඩී. ඕ. එව්. කේ/01/243/96 හි ලියාපදිංචි වී ඇත.

වර්ෂ 2005ක් වූ ජූනි මස 23 වැනි දින කොළඹ දී ය.
ඉහත නම සඳහන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.
සාමාන්‍යාධිකාරී.

07-279

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 2300000130.

ණයකරුගේ සම්පූර්ණ නම : හේවා වඩුගේ සුනිල් සේනාධීර.

(මෙහි මින් මතු "එකී පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2004.09.03 වැනි දින අංක 1357 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2004.09.14 වැනි දින "ලක්බිම", "ද අයිලන්ඩ්", "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස පහත විස්තර කර තිබෙන දේපළ, කෝට්ටේ, බැද්දගාන පාර, අංක 134, යන ස්ථානයේ පදිංචි බලයලත් වෙන්දේසිකරු ජී.කේ. ඊ. සේනාපති මහතා විසින් 2005.07.27 වැනි දින ප. ව. 2.30 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

(1) එකී දේපළ උකස මත සංස්ථාවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් තුන්ලක්ෂ හැත්තෑ දහසක (රු. 3,70,000) මුදල ද, 2004.01.31 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් දෙලක්ෂ හතළිස් පන්දහස් හත්සිය හතළිස් හතරයි ශත පනස් එකක (රු. 2,45,744.51) වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් හයලක්ෂ පහළොස්දහස් හත්සිය හතළිස් හතරයි ශත පනස් එකක් (රු. 6,15,744.51) ද,

(2) එකී රුපියල් තුන්ලක්ෂ හැත්තෑ දහසක (රු. 3,70,000) මුදල මත අයවිය යුතු වර්ෂයකට 17% බැගින් වන පොළියක් 2004.02.01 වැනි දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකරගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

### දේපළ පිළිබඳ විස්තරය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, පහත බුලත්ගම දෙහිගම්පල් කෝරලේ, රුවන්වැල්ල ප්‍රාදේශීය සභා සීමාවේ යටත්ල ග්‍රාමයේ හි පිහිටි අරඹ නැමැති ඉඩමට 1998.06.05 දින එම්. ඩී. සී. කුමාර මානක තැන විසින් මැන සම්පාදිත අංක 227 පිඹුර ප්‍රකාර උතුරට : සී. පියසේනට අයත් අරඹ කියන ඉඩම ; නැගෙනහිරට : අඩි පාර ද ; දකුණට : ටී. වී. යූ. රණසිංහට අයත් අරඹ කියන ඉඩම ; බටහිරට : ඩී. ජී. ගුණවර්ධනට අයත් අරඹ කියන ඉඩම යන මායිම් තුළ පිහිටි පර්චස් තිස් එකයි දශම නවය ( අක්. 0,රූ.0, පර්.31.09) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද සමඟ වේ. මෙය අව්ස්සාවෙල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එස්. 125/216 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2005ක් වූ ජූනි මස 23 වැනි දින කොළඹ දී ය.
ඉහත නම සඳහන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.
සාමාන්‍යාධිකාරී.

07-281

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0104401079.

ණයකරුගේ සම්පූර්ණ නම : නෙයි සුලෙයිහා තෙන්නකෝන්.

(මෙහි මින් මතු "එකී පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2004.01.02 වැනි දින අංක 1322 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2004.01.05 වැනි දින "දිනමිණ", "ද අයිලන්ඩ්", "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස පහත විස්තර කර තිබෙන දේපළ, කෝට්ටේ, බැද්දගාන පාර, අංක 134, යන ස්ථානයේ පදිංචි බලයලත් වෙන්දේසිකරු ජී.කේ. ඊ. සේනාපති මහතා විසින් 2005.07.25 වැනි දින පෙ. ව. 10.30 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

(1) එකී දේපළ උකස මත සංස්ථාවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් අටලක්ෂ දහඳහස් අටසිය හැත්තෑ අටයි ශත හැත්තෑ හතක (රු. 6,10,878.77) මුදල ද, 2003.05.31 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් එක්ලක්ෂ හැටදහස් අටසිය තිස් තුනයි ශත තිස්අටක් (රු. 1,60,833.38) වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් හත්ලක්ෂ හැත්තෑ එක්දහස් හත්සිය දොළහයි ශත පහළොවක් ( 7,71,712.15) ද,

(2) එකී රුපියල් හයලක්ෂ දහඳහස් අටසිය හැත්තෑ අටයි ශත හැත්තෑ හතක (රු. 6,10,878.77) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15% බැගින් වන පොළියක් 2003.06.01 වැනි දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකරගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

### දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ, මහරගම ප්‍රාදේශීය සභා සීමාවේ, නාවින්න ග්‍රාමයෙහි පිහිටි ගෙවත්ත නමැති ඉඩමට 1992.04.24 දින ඒ. පී.දැරණියගල මානක තැන විසින් මැන සම්පාදිත අංක 720 පිඹුර ප්‍රකාර ලොට් වී. මායිම් උතුරට:කැබැලි අංක ඒ ; නැගෙනහිරට : කැබැලි අංක සී ; දකුණට : කැබැලි අංක ඊ ; බටහිරට : ඒ. ඒ. විමලසේන හිමිකම් කියන ඉඩම යන මායිම් තුළ පිහිටි පර්චස් නවයක් ( අ.0, රූ. 0, පර්. 9.39) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලු දේද මාර්ග පරශවතාවය ද සමඟ ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම්. 1874/59 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2005ක් වූ ජූනි මස 23 වැනි දින කොළඹ දී ය.
ඉහත නම සඳහන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.
සාමාන්‍යාධිකාරී.

07-282

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 1900001516 සහ 1900002194.

ණයකරුගේ සම්පූර්ණ නම : ජයසිංහ ආරච්චිගේ මාකස් මහින්ද ජයසිංහ.

(මෙහි මින් මතු "එකී පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2005.06.03 වැනි දින අංක 1396 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2005.06.08 වැනි දින "ලක්බිම", "ද අයිලන්ඩ්", "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස පහත විස්තර කර තිබෙන දේපළ, මීගමුව, ඩයස් ගරාජ් ගොඩනැගිල්ල, ප්‍රනාන්දු ඇවිනියු අංක 22 යන ස්ථානයේ පදිංචි බලයලත් වෙන්දේසිකරු වන ඩබ්ලිව්. ජී. සී. පෙරේරා මයා විසින් 2005.07.22 වැනි දින පෙ. ව. 10.30 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

(1) එකී දේපළ උකස මත සංස්ථාවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ අනූඑක් දහස් හත්සිය තිහයි ශත හැට දෙකක (රු. 1,91,730.62) මුදල ද, 2003.01.31 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් පනස්අට දහස් හයසිය පනහයි ශත හතලිස් දෙකක් (රු. 58,650.42) වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ පනස්දහස් තුන්සිය අසූඑකයි ශත හතරක් (රු. 2,50,381.04) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ අනූඑක් දහස් හත්සිය තිහයි ශත හැට දෙකක (රු. 1,91,730.62) මුදල, මත අයවිය යුතු වර්ෂයකට 13.5% සහ 15% බැගින් වන පොළියක් 2003.02.01 වැනි දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකරගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

### දේපළ පිළිබඳ විස්තරය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, උතුරු පිටිගල් කෝරලේ, ආනයිවිලුන්දන් පත්තුවේ, ආරච්චිකට්ටුවේ ප්‍රාදේශීය සභාවේ, කිරියන්කල්ලිය ග්‍රාමයෙහි පිහිටි සන්දිතෝට්ටම් නමැති ඉඩමට 1998.02.02 දින පොත්තංගවිඩ්වේලූ මානක තැන විසින් මැන සම්පාදිත අංක 04 පිඹුර ප්‍රකාර ලොට් 01 ට මායිම්, උතුරට : මහ පාරේ සිට අගුණුවිලට වැටී ඇති පාර ද; නැගෙනහිරට : එන්. එම්. එම්. එස්. මරික්කාර්ට අයිති ඉඩම ද ; දකුණට : ඩබ්ලිව්. එස්. එම්. එන්. මරික්කාර්ට අයිති ඉඩම ද ; බටහිරට : එන්. එම්. එම්. ඒ. මරික්කාර්ට අයිති ඉඩම ද යන මායිම් තුළ පිහිටි පර්චස් තිහක් (අ.0, රූ. 0, පර්. 30) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලු දේද සමඟ හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී. 136/68 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2005ක් වූ ජූනි මස 16 වැනි දින කොළඹ දී ය.
ඉහත නම සඳහන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.
සාමාන්‍යාධිකාරී.

07-284

---

## මහජන බැංකුව - රාගල ශාඛාව

1996 අංක 32 පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මධ්‍යම පළාතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ වලපනේ ආදායම් පාලන නිලධාරී කොට්ඨාශයේ යටිපළාත කෝරළේ හරස් බැද්ද ග්‍රාමසේවක නිලධාරී කොට්ඨාශයේ හරස්බැද්ද නාවෙල යනුවෙන් හැඳින්වෙන ඉඩමට මැනුම්පති විසින් සාදන ලද ඔහු විසින් සහතික කරන ලද 1976.01.01 සහ අංක 250 දරන පිඹුරේ කැබලි අංක 500 යනුවෙන් සලකුණු කොට ඇති අක්කර එකයි, රූඩ් එකයි, පර්චස් හතරක් (අක්. 01, රූඩ් 01, පර්චස් 04) විශාල වගා කටයුතු සඳහා යෝග්‍ය ඉඩම සහ එහි පිහිටි නිවස ඇතුළු සෑම සියලු දේ මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත 2005 ක්වූ ජූලි මස 20 වැනි දින ප. ව. 3.00 ට දේපල පිහිටි ස්ථානයේදී අප විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා *රජයේ ගැසට් පත්‍රයේ* 1998.05.22 දින පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.*– නුවරඑළියේ සිට රාගල මාර්ගයේ සැතපුම් 10ක් පමණ ගමන් කළ පසු මාර්ගයේ වම්පසට විහිදෙන වලපනේ මාර්ගයේ සැතපුම් 6ක් පමණ ගමන් කළ පසු හමුවන හරස්බැද්ද කඩවීදියේ වම්පසට විහිදෙන වතු පාරේ සැතපුම් 1/8ක් පමණ ගමන් කළ විට ඉඩම පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10%ක් ද,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරු සහ නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක්,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත මහජන බැංකුවේ නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකරු වෙත ගෙවිය යුතුය.

දුරකථන අංක: 052-2222557 ෆැක්ස් අංකය: 052-2234756.
052-2222555.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ෂොක්මන් සහ සමරවික්‍රම,
ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම වරලත් වෙන්දේසිකරුවෝ
(රාජ්‍ය හා පෞද්ගලික බැංකුකරුවන්
වෙනුවෙන් සහ උසාවි කොමසාරිස්වරු).

| | |
|---|---|
| *ප්‍රධාන කාර්යාලය :* | *නාගරික කාර්යාලය:* |
| අංක 24, | අංක 55 ඒ, |
| ටොරින්ටන් පාර, | ධර්මපාල මාවත, |
| මහනුවර. | කොළඹ 03 |
| දුරකථන: 081-2224371/2227593 | දුරකථන අංක: 011-2448526/ 0111-2441761 |
| ෆැක්ස් අංකය: 081-2224371 | ෆැක්ස් අංකය: 011-2448526 |
| | ඊ මේල් : samera@sri.lanka.net |

07-244

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ
53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 1/27096/සීබී8/692 සහ 1/28788/සීබී9/639.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවා වූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2005.03.24 දින *රජයේ ගැසට් පත්‍රයේ* සහ 2005.04.11 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, පන්නිපිටිය, හයිලෙවල් පාර, අංක 145 හි බලයලත් වෙන්දේසිකාර එම්. සමරනායක මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2005.09.03 වැනි දින පෙරවරු 11.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ උතුරු පිටිපන පිහිටි කිරිබේරියකැලේ සහ හොරගහකිස්සිය කුඹුර හෝ ගබඩාවවත්ත හෙවත්'කැරිලන්ඩ් නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එස්. ඒ. සුගතපාල විසින් සැකසුණු 1994.02.26 දින හා අංක 715 දරන පිඹුරේ කැබලි අංක 49 බී ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 9.05 ක්වූ දේපළ හා ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ. මෙම ඉඩම් කොටස කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 104/161 යටතේ ලියාපදිංචි කොට ඇත.

තවද, පිඹුරු අංක 573 හි කැබලි අංක 71, 72, 75 සහ 77 (අඩි 20 ක් පළල පාර සඳහා වෙන් වූ කොටස) කොටස් මතින් වැටී ඇති මාර්ග අයිතිය ද සමග වේ.

ඩබ්. ඩී මෙන්ඩිස්,
*වැඩ බලන සාමාන්‍යාධිකාරි.*

2005 ජුනි මස 24 වැනි දින,
කොළඹ 3,
ගාලු පාරේ,
අංක 269.
07-291/11

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0804400084.

ණයකරුගේ සම්පූර්ණ නම : නන්දසේන සේනාවීර.

(මෙහි මින් මතු "එකී පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2005.05.06 වන දින අංක 1392 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2005.06.01 වන දින 'ලක්බිම', 'ද අයිලන්ඩ්', 'තිනක්කුරල්' පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකරගැනීම පිණිස පහත විස්තර කර තිබෙන දේපළ මාතර, කුරුඳුවත්ත, වල්ගම හි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන ජී. පී. ආනන්ද මයා විසින් 2005.07.27 වන දින ප. ව. 1.00ට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

(1) එකී දේපළ උකස මත සංස්ථාවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ අසූදහස් හයසිය අනූඑකයි ශත තුනක (රු. 1,80,691.03) මුදල ද, 2004.07.31 දින දක්වා පොළිය වශයෙන් රුපියල් හතළිස් හතර දහස් නවසිය අසූවයි ශත පනස් පහක් (රු. (රු. 44,980.55) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ විසිපන්දහස් හයසිය හැත්තෑ එකයි ශත පනස් අටක් (රු. 2,25,671.58) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ අසූදහස් හයසිය අනූ එකයි ශත තුනක (රු. 1,80,691.03) මුදල මත අයවිය යුතු වර්ෂයකට 14 % බැගින් වන පොළියක් 2004.08.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකරගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

### උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරළේ, කොහුණුගමුව ග්‍රාමයෙහි පිහිටි හැන්නලියද්ද නමැති ඉඩමට 1998.11.15 දින එස්. සමරසිංහ මානක තැන විසින් මැන සම්පාදිත අංක 583 පිඹුර ප්‍රකාර ලොට් 01 ට මායිම් උතුරට : එම ඉඩමේම ලොට් 02 ද, නැගෙනහිරට : එම ඉඩමේම ලොට් 03 සහ වැලිකනටිය ද, දකුණට : බෝගහලියද්ද ද, බටහිරට : මහ ලියද්ද ද යන මායිම් තුළ පිහිටි පර්චස් විසිනවයයි දශම හතක (අක්. 0, රූඩ් 0, පර්. 29.7) වපසරියකින් යුතු මෙම ඉඩම් හා ඊට අයත් සියළුදේද, මාර්ග පරවශතාවය ද සමග මාතර ඉඩම ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 987/19 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2005ක් වූ ජුනි මස 23 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරි.

07-290

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 2500001067/2500001171.

ණයකරුගේ සම්පූර්ණ නම : වික්‍රම ආරච්චිලාගේ උපාලි ලීලානන්ද.

(මෙහි මින් මතු "එකී පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2003.11.21 වන දින අංක 1316 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2004.08.07 වන දින 'දිනමිණ', 'ද අයිලන්ඩ්', 'තිනක්කුරල්' පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකරගැනීම පිණිස පහත විස්තර කර තිබෙන දේපළ මහනුවර, හීරැස්සගල, මවුන්ට් ප්ලසන්ට් ගාඩ්න්ස්, අංක 432/1 යන ස්ථානයේ පදිංචි බලයලත් වෙන්දේසිකරු වන අයි. ඩබ්. ජයසූරිය මයා විසින් 2005.07.30 වන දින පෙ. ව. 11.00 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

(1) එකී දේපළ උකස මත සංස්ථාවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් දෙලක්ෂ අනූඅටදහස් හත්සිය විසිහතරයි ශත දහහතරක (රු. 2,98,724.14) මුදල ද, 2003.01.31 දින දක්වා පොළිය වශයෙන් රුපියල් දෙලක්ෂ හතළිස් පන්දහස් හත්සිය හතළිස් හතරයි ශත පනස් එකක් (රු. 2,45,744.51) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් හයලක්ෂ පහළොස්දහස් හත්සිය හතලිස් හතරයි ශත පනස් එකක් රු. 6,15,74.51) ද,

(2) එකී රුපියල් දෙලක්ෂ අනූඅටදහස් හත්සිය විසිහතරයි ශත දහහතරක (රු. 2,98,724.14) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15% සහ 15% බැගින් වන පොළියක් 2003.02.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකරගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

### උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, පරණකූරු කෝරළේ, කඳුඅහපත්තුවේ කෑගල්ල ප්‍රාදේශීය සභා සීමාවේ මාබෝපිටිය ග්‍රාමයෙ හි පිහිටි ගලකොටුව නමැති ඉඩමට 1999.07.21 දින ආර්. කේ. නිස්සංක මානක තැන විසින් මැන සම්පාදිත අංක 99/14/ඒ පිඹුර ප්‍රකාර ලොට් 01 බී ට මායිම්, උතුරට : ලොට් 1 ඒ ද, නැගෙනහිරට : ඉහල දෙනිය කුඹුරේ පිල්ලැව අංගේ කුඹුරේ පිල්ලැව හා මදුගහමුල හේන ද, දකුණට : මදුගහමුල හේන හා පාර ද, බටහිරට : පාර ද යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් විස්සක් (අ. 0, රූ. 1, පර්. 20) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළුදේද සමග කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 536/206 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2005ක් වූ ජුනි මස 23 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරි.

07-289

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 2503300398.

ණයකරුගේ සම්පූර්ණ නම : කුරම්පල ගමරාළලාගේ සුමනතිස්ස ජයතිලක.

(මෙහි මින් මතු "එකී පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2003.06.06 වන දින අංක 1292 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2003.07.14 වන දින 'දිනමිණ', 'ද අයිලන්ඩ්', 'තිනක්කුරල්' පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකරගැනීම පිණිස පහත විස්තර කර තිබෙන දේපළ කෝට්ටේ බැද්දගාන, අංක 134 යන ස්ථානයේ පදිංචි බලයලත් වෙන්දේසිකරු වන පී. කේ. ඊ. සේනාපති මයා විසින් 2005.07.28 වන දින ප. ව. 1.30ට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

(1) එකී දේපළ උකස මත සංස්ථාවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හැත්තෑ හත්දහස් අටසිය දොළහයි ශත හැට දෙකක (රු. 77,812.62) මුදල ද, 2002.08.31 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් තිස්හත්දහස් හාරසිය හැත්තෑ දෙකයි ශත අටක් (රු. 37,472.08) ද, වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ පහළොස් දහස් දෙසිය අසූ හතරයි ශත හැත්තෑවක් (රු. 1,15,284.70) ද,

(2) එකී රුපියල් හැත්තෑ හත්දහස් අටසිය දොලහයි ශත හැට දෙකක (රු. 77,812.62) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15% බැගින් වන පොළියක් 2002.09.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකරගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

### දේපළ පිළිබඳ විස්තරය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, දෙහිගම්පල් කෝරළේ, මෙගොඩපොත පත්තුවේ යටියන්තොට ප්‍රාදේශීය සභා බල සීමාව තුළ ගණිතකන්ද පිහිටි ඒදණ්ඩමුලහේන නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. අබේසිරිවර්ධන විසින් මැන සාදන ලද අංක 2020 සහ 1995.09.05 දින දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 1 මායිම්, උතුරට : රජයේ ඉඩමද, නැගෙනහිරට : ප්‍රධාන පාරද, දකුණට සහ බස්නාහිරට : කැබලි අංක 2 ද යන සීමාව තුළ පිහිටි පර්චස් දහසයයි දශම අටයි හතරක (අ. 0, රූ. 0, පර. 16.84) විශාල ඉඩම වේ. මෙය අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක එස් 111/223 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2005ක් වූ ජුනි මස 23 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

07-288

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0700001119.

ණයකරුගේ සම්පූර්ණ නම : දීප්තිකා ජානකී මලවිපතිරණ සහ සුජීව ද සිල්වා සමරසිංහ.

(මෙහි මින් මතු "එකී පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2004.10.01 වන දින අංක 1361 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2004.12.07 වන දින 'ලක්බිම', 'ද අයිලන්ඩ්', 'තිනක්කුරල්' පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකරගැනීම පිණිස පහත විස්තර කර තිබෙන දේපළ මාතර, කුරුඳුවත්ත, වල්ගම හි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන ජී. පී. ආනන්ද මයා විසින් 2005.07.26 වන දින ප. ව. 2.30 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

(1) එකී දේපළ උකස මත සංස්ථාවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ තිස් හත්දහස් අටසිය හතළිස් පහයි ශත අනූ අටක (රු. 1,37,845.98) මුදල ද, 2003.10.31 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් තිස්නව දහස් අටසිය පනස් තුනයි ශත විසි හතක් (රු. 39,853.27) ද, වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ හැත්තෑ හත්දහස් හයසිය අනූනවයයි ශත විසි පහක් (රු. 1,77,699.25) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ තිස්හත්දහස් අටසිය හතළිස් පහයි ශත අනූ අටක (රු. 1,37,845.98) මුදල මත අයවිය යුතු වර්ෂයකට 13.50% බැගින් වන පොළියක් 2003.11.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකරගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

### උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර නියාගම ග්‍රාමයේ හි පිහිටි ගමගේ වත්ත ලොට් 01 නමැති ඉඩමට 2000.06.27 දින ඒ. ඩී. බී. ගුණසේකර මානක තැන විසින් මැන සම්පාදිත අංක 1981 පිඹුර ප්‍රකාර ලොට් 01 ට මායිම්, ඊසානට : එම ඉඩමේම ලොට් 03 ද, ගිණිකොනට : එම ඉඩමේම ලොට් 03 ද, නිරිතට : පාරද, වයඹට : එම ඉඩමේම ලොට් 01 ද, යන මායිම් තුළ පිහිටි පර්චස් දහයක (අ. 0, රූ. 0, පර්. 10) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළුදේද, මාර්ග පරවශතාවය ද සමග ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 164/133 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2005ක් වූ ජුනි මස 23 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

07-287

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0900000286.

ණයකරුගේ සම්පූර්ණ නම : මොහොමඩ් ජෙමල් මොහොමඩ් සෆාන්.

(මෙහි මින් මතු "එකී පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2002.12.20 වන දින අංක 1268 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2003.01.23 වන දින 'දිනමිණ', 'ද අයිලන්ඩ්', 'තිනක්කුරල්' පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකරගැනීම පිණිස පහත විස්තර කර තිබෙන දේපළ මාතර, කුරුඳුවත්ත, වල්ගම හි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන ජී. පී. ආනන්ද මයා විසින් 2005.07.27 වන දින ප. ව. 2.30 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

(1) එකී දේපළ උකස මත සංස්ථාවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ දහනව දහසක (රු. 1,19,000) මුදල ද, 2002.07.31 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් අසූදෙදහස් හත්සිය අසූ තුනයි ශත හැත්තෑවක් (රු. 82,783.70) ද, වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ එක්දහස් හත්සිය අසූ තුනයි ශත හැත්තෑවක් (රු. 2,01,783.70) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ දහනව දහසක (රු. 1,19,000) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15.71% බැගින් වන පොළියක් 2002.08.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකරගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

### දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරළේ, වැලිපිටිය වත්තේගෙදරමුල්ල පිහිටි දම්පේ පාර වරිපනම් අංක 27බී දරන දම්පෙවත්ත කැබලි අංක 3 නමැති ඉඩමට වර්ෂ 1998.01.15 දින එම්. සී. එම්. රාෂිම් මානක තැන විසින් අඳින ලද අංක 537 පිඹුරේ කැබලි අංක 'ඒ' ට මායිම් උතුරට : පාර, නැගෙනහිරට සහ දකුණට : මෙම ඉඩමේම කොටසක් වන කැබලි අංක 36, බටහිරට : දම්පෙවත්ත සිට නිවාසවලට දිවෙන පාර යන මායිම් තුළ පිහිටි පර්. 19.95ක් (අ. 0, රූ. 0, පර්. 19.95) විශාල ඉඩම තුළ පිහිටි සියළු දේ සමග වේ. මෙය මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක ඩී 927/220 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2005ක් වූ ජුනි මස 23 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

07-286

---

## මහජන බැංකුව - මලියදේව ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ
29ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

**නාරම්මල නගර සභා සීමාව තුල**

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙනි හත්පත්තුවේ, උඩුකහ උතුරු කෝරළේ, ලිනියවත්ත නමැති ගමෙහි පිහිටා ඇති 'තිබ්බටුවේ හේන එස්ටේට්' නමැති ඉඩමට සාදා ඇති අංක 1953/1 සහ 1996.09.05 දරන පිඹුරේ ප්‍රකාර කැබලි අංක 02 දරන විශාලත්වය අක්. 0, රූඩ්. 0, පර්චස් 19.8ක් විශාල ඉඩම සහ ඊට අයිති සියළු දේත් සමග මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2005.07.26 දින පෙ. ව. 11.00ට දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2003.03.14 දින, දිනමිණ පුවත්පතේ 2003.08.08 දින දී ද, ඩේලිනිව්ස් පුවත් පතේ ද 2003.08.08 දින දී ද, තිනකරන් පුවත් පතේ 2003.08.08 දින දී පලකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපලට පිවිසීම.*–නාරම්මල සිට කුලියාපිටිය පාරේ, සැ. 1/2ක් පමණ ගිය විට, රනස්ගල්ල මෙටල් ඉන්ඩස්ට්‍රීස් ආයතනයට යාබදව පාරේ දකුණු පසින් මහාමාර්ගයට මායිම්ව, මෙම දේපල පිහිටා ඇත. නාරම්මල නගර සීමාවට අයත්ය.

*ගෙවීමේ ක්‍රමය.*–වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කල යුතුය.

1. ගැනුම් මිලෙන් 10%ක්,
2. පලාත් අධිකාරියේ බදු සඳහා පලාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක්,
5. විකුණුම් වියදම සමහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැනුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුලත මහජන බැංකුව, කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රාදේශීය කළමණාකරු වෙත ගෙවිය යුතුය.

දුරකථන අංක : 037-2222453
ෆැක්ස් : 037-2222338

හිමිකම් සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි මුදල් දින 30ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඩබ්ලිව්. එම්. අයි. ගල්ලැල්ල (සාමවිනිසුරු),
උසාවි කොමසාරිස් බලයලත්
වෙන්දේසිකරු සහ තක්සේරුකරු.

අංක 28, නව නිතිඥ සහ වෙළඳ සංකීර්ණය,
කුමාරතුංග මාවත, කුරුණෑගල.
දුරකථන අංක : 037-2220062
07-239

---

## මහජන බැංකුව - යක්කල ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

කටාන, හල්පෙ හි පදිංචියට සුදුසු පරිසරයක පිහිටි අක්කර එකයි රූඩ් දෙකයි පර්චස් විසිපහ (අ. 1, රූ. 2 පර්. 25)ක නිවසක් සහිත ඉඩම මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින්, 2005.09.07 වන දින පෙ. ව. 10.30ට ප්‍රසිද්ධ වෙන්දේසියේ දේපල පිහිටි ස්ථානයේ දී විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 1999.09.30 දින ද, ඩේලිනිවිස්, දිනමිණ, සහ තිනකරන් පුවත්පත් වල 1999.08.09 දින ද, පල කර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපලට පිවිසීම.*–මීගමුව සිට කටාන පාරේ කි. මී. 10ක් ගියවිට වම්පසින් හමුවන හල්පෙ පාවුලු විද්‍යාලයට මෙපිටින් පිහිටි දෙවන නිවස හා ඉඩම සුරැකුම් දේපල වේ.

*ගෙවීමේ ක්‍රමය.*–වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කල යුතුය.

1. ගැනුම් මිලෙන් 10%ක්,
2. පලාත් අධිකාරියේ බදු සඳහා පලාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක්,
5. විකුණුම් වියදම සමඟ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැනුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුලත මුදුන්ගොඩ, බැලුම්මහර, නුවර පාර, අංක 131, මහජන බැංකුව, බටහිර කලාප 111 කාර්යාලයේ සහකාර සාමාන්‍යාධිකාරී වෙත ගෙවිය යුතුය.

දුරකථන අංකය : 033-2222325, 033-2225008, 033-2226741
ෆැක්ස් අංකය : 033-2226165

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කල මුදල් දින 30ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඩබ්. ජී. සී. පෙරේරා,
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස්.

අංක 22,
ප්‍රනාන්දු මාවත,
මීගමුව.
දුරකථන අංකය : 031-2223219.
07-210/1

---

## මහජන බැංකුව - නිට්ටඹුව ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

පල්ලෙවෙල, වේරගොඩ, කොටකන්දවත්ත, අංක 41 දරන ස්ථානයේ පදිංචියට සුදුසු පරිසරයක පිහිටි නිවසක් සහිත අක්කර තුනයි රූඩ් දෙකයි පර්චස් දහහතරයි දශම එකයි පහ (අ. 3, රූ. 2, පර්. 14.15)ක ඉඩම

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින්, 2005.08.25 වන දින පෙ. ව. 10.30ට ප්‍රසිද්ධ වෙන්දේසියේ දේපල පිහිටි ස්ථානයේ දී විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2003.10.17 දින ද, ඩේලිනිවිස්, දිනමිණ, සහ තිනකරන් පුවත්පත් වල 2004.04.21 දින ද, පල කර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපලට පිවිසීම.*–නිට්ටඹුව නගරයේ සිට හුඹුටියාව පාරේ කි. මී. 5ක් පමණ ගමන් කරන විට හමුවන කුඹිල්ඔලුව හන්දියෙන් වමට පල්ලෙවෙල පාර පිහිටා ඇත.

එම පාරේ කි. මී. 1 1/2ක් පමණ යන විට වේරගොඩ හන්දිය හමුවේ. එතැනින් දකුණු පසට ඇති පිල්ලව පාරේ කි. මී. 1ක් පමණ යන විට දකුණු පසට කොටකන්දවත්තට යන පාර හමුවේ. එම මාර්ගයේ මී. 500ක් පමණ යන විට සුරැකුම් දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*–වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කල යුතුය.

1. ගැනුම් මිලෙන් 10%ක්,
2. පලාත් අධිකාරියේ බදු සඳහා පලාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක්,
5. විකුණුම් වියදම සමඟ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැනුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුලත මුදුන්ගොඩ, බැලුම්මහර, නුවර පාර, අංක 131, මහජන බැංකුව, බටහිර කලාප 111 කාර්යාලයේ සහකාර සාමාන්‍යාධිකාරී වෙත ගෙවිය යුතුය.

දුරකථන අංකය : 033-2222325, 033-2226741
ෆැක්ස් අංකය : 033-2226165

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කල මුදල් දින 30ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඩබ්. ජී. සී. පෙරේරා,
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස්.

අංක 22,
ප්‍රනාන්දු මාවත,
මීගමුව.
දුරකථන අංකය : 031-2223219.
07-210/2

---

## නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ්

(කලින් ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධන බැංකුව නමින් හැඳින්වුණු)

2- බෙදා වෙන් කොට සීමා නිර්නය කළ අගනා ඉඩම් -2

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ පුත්තලම් කඩවත කොට්ඨාසය තුළ, පුත්තලම් කඩවත, පුත්තලම නගරයේ "වේන්නෙයිකුඩිරිප්පු "ගමේ පිහිටි "පෙරියවිල්ලු කානි" සහ "පෙරිය විල්ලු ටෝට්ම්" නැමති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු පී. තඟවඩිවේලු විසින් සාදන ලද 2000.04.18 දාතම හා අංක 997 දරන පිඹුරේ ලොට් 1 සහ ලොට් 2 වශයෙන් ලකුණු කොට දක්වා ඇති ප්‍රමාණයෙන් ලොට් 1- අක්. 3, රූඩ් 0, පර්. 2.07 සහ ලොට් 2 - අක්. 3 රූඩ් 0, පර්. 2.07 වන බෙදා වෙන් කොට සීමා නිර්නය කළ ඉඩම් 2, දැනට හෝ මින් මතුවට හෝ ඉහත ඉඩමේ හා පරිශ්‍රයේ තිබෙන ගොඩනැගිලි සහ වෙනත් දේද ඉහත කී එහි පිහිටි ඉඩමට හා පරිශ්‍රයට සහ ගොඩනැගිලි වලට ස්ථිරව සවිකොට ඇති/යා කොට ඇති යන්ත්‍රාගාර, යන්ත්‍රසූත්‍ර, උපකරණ, ආම්පන්න සහ වෙනත් දේ සමඟ 2005 ජූලි 25 වැනි දා - සඳුදා පෙ. ව. 11.30 ට දේපල පිහිටි ස්ථානයේදී ද එසේම එදිනම ප. ව. 12.30 පහත සඳහන් දේපලද පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ පුත්තලම් කඩවත් කොට්ඨාසය තුළ පුත්තලම් කඩවත්හි පුත්තලම නගරයේ අනුරාධපුර පාරේ පිහිටි "උදයාර්කුලම් සහ මලයප්පන්කුලම්" නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු පොත් තඟවඩිවේලු විසින් සාදන ලද 2001.05.26 දාතම හා අංක 1668 දරන පිඹුරේ ලොට් 1, 2 හා 3 වශයෙන් ලකුණු කොට දක්වා ඇති ප්‍රමාණයෙන් අක්. 0, රූඩ් 1, පර්. 20.06 ක් වන බෙදා වෙන් කොට සීමා නිර්නය කළ සම්පූර්ණ ඉඩම එහි පිහිටි ගහකොල, වගාවන්, ගොඩනැගිලි සහ එයට ස්ථිර ලෙස යකොට ඇති හෝ සවිකොට ඇති වෙනත් දේද සමගය. (එච්එම්බීඑස් ඉම්පෝටර්ස් ඇන්ඩ් එක්ස්පෝටර්ස් යන නාමය යටතේ හවුලේ ව්‍යාපාරික කටයුතු කවත් දෙදෙනකු හා සමඟ පවත්වාගෙන යන මොහමඩ් හනීෆා රිනොස් සහ මොහමඩ් හනීෆා බහීර් යන අයට අයත් දේපොල)

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2003.06.27 දින රජයේ ගැසට් පත්‍රයද, 2003.06.12 හිනකරන් හා අයිලන්ඩ් සහ 2002.12.06 දිවයින පුවත්පත්ද සහ විකුණුම් නිවේදනය සඳහා 2005.07.08 වන දින *රජයේ ගැසට් පත්‍රයද* බලන්න.

*ගාස්තු ගෙවන පිළිවෙල* :

1. මිල තීන්දු වූ වහාම ගැනුම් මිළ,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු සියයට එකක (1%) දේශීය අලෙවි බද්ද,
3. විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක) වෙන්දේසිකරුගේ කොමිස් මුදල,
4. රු. 74,413 නොඉක්මවන ප්‍රචාරක වියදමින් 50% ක්,
5. ලිපිකරු හා නිවේදකගේ ගාස්තුව රු. 500,
6. වෙන්දේසියේ විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තුව රු. 2,500.

හිමිකම් ඔප්පු හා වෙනත් අදාල ලිපිලේඛන කොළඹ 2, නවම් මාවත, නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ් හි සහකාර සාමාන්‍යාධිකාරී (නීති) සී. එල්. ජයවර්ධන මහත්මිය වෙතින් ලබාගෙන පරීක්ෂා කළ හැකිය.

දුරකථනය : 2437707-10/2440194

ඩන්ස්ටන් කෙලාට්,
උසාවි කොමසාරිස් සහ බ්‍රෝකර්,
විශේෂඥ වෙන්දේසිකරු තක්සේරුකරු
සහ දේපල නියෝජිත.

381-1/1, ගාල පාර, කොළඹ 04.
දුරකථන : 2591167 දුරකථන/ෆැක්ස් : 2584874, 2500838
ක්ෂණික ඇමතුම් : 0722 - 250422
07-294

---

## සීමාසහිත සෙලාන් බැංකුව - (පරණ යොන් විදිය ශාඛාව)

1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ විකිණීමයි

### බෙදා වෙන් කොට සීමා නිර්නය කළ සම්පූර්ණ ඉඩම

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ අළුත්කුරු කෝරලේ, රාගම පත්තුවේ, බත්ගම්මුල්ල පාරේ පිහිටි, "කහටගහවත්ත" නැමති ඉඩමෙන් බලය ලත් මිනින්දෝරු එම්. ඩී. ජේ. වී. පෙරේරා විසින් මැන සාදන ලද 1986 අගෝස්තු 20 දාතම හා අංක 9264 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 ඒ වශයෙන් ලකුණු කොට දක්වා ඇති ප්‍රමාණයෙන් පර්චස් 12.10 ක ඉඩම එහි පිහිටි නිවස, ගහකොළ, වගාවන් හා අනෙකුත් සියළු දේ සමග සහ පහත සඳහන් මාර්ග මතින් හා ඔස්සේ මාර්ග අයිතියද සමගය.

1. එකී අංක 9264 පිඹුරේ නිරූපිත ලොට් එක්ස් මතින් මාර්ග අයිතිය.
2. බලයලත් මිනින්දෝරු එම්. ඩී. ජේ. වී. පෙරේරා විසින් සාදන ලද 1969.11.08 දාතම හා අංක 1426 දරන පිඹුරේ නිරූපිත ලොට් 5 මතින් මාර්ග අයිතිය සහ එකී අංක 1426 පිඹුරේ දැක්වෙන ළිඳ පාවිච්චි කිරීමේ අයිතියද සමගය.

සීමාසහිත සෙලාන් බැංකුව විසින් මා වෙත පවරා ඇති බලය පරිදි ඉහත කී දේපල මා විසින් 2005 ජූලි 26 වැනිදා අහහරුවාදා පෙ. ව. 10.30 ට දේපල පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

එසේම

මධ්‍යම පළාතේ, මහතුවර දිස්ත්‍රික්කයේ, මහතුවර මහ නගර සභා සීමාව තුළ දොඩන්වෙල පිහිටි, ශ්‍රී පුෂ්පදාන මාවතේ, වරිපනම් අංක 61 (කොටසක්) දරන 'බහිරව කන්ද' නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු සෙනරත් විජේරත්න විසින් මැන සාදන ලද 1994 ජනවාරි 6 දාතම හා අංක 2663 දරන පිඹුරේ ලොට් 01 වශයෙන් ලකුණු කොට නිරූපිත (ප්‍රමාණයෙන් පර්චස් 12 ක ඉඩම) බෙදා වෙන් කොට සීමා නිර්නය කරන ලද ඉඩම එහි පිහිටි ගහකොල, වගාවන් සහ අනෙකුත් සියළු දේ සමග සහ එකී අංක 2663 පිඹුරේ නිරූපිත මාර්ග මතින් හා ඔස්සේ මාර්ග අයිතිය හා අනෙකුත් අයිතීන්ද, සහ ප්‍රසිද්ධ නොතාරිස් එම්. ආර්. ඒ. කරීම් විසින් ලියා සහතික කළ 1964.11.24 දාතම හා අංක 303 දරන ඔප්පුවේ සඳහන් කර ඇති පාර සහ ඉඩම් මතින් හා ඔස්සේ මාර්ග අයිතිය හා අනෙකුත් අයිතීන්ද සමගය. සීමාසහිත සම්පත් බැංකුව විසින් මා වෙත පවරා ඇති බලය පරිදි ඉහත කී දේපල මා විසින් 2005 ජූලි 28 වැනි දා බ්‍රහස්පතින්දා පෙ. ව. 11.30 ට දේපල පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

(කොළඹ 12/රාගම මොහමඩ් අරූස් රාසික් යන අය බන්ධනදායී වශයෙන් ප්‍රසිද්ධ නොතාරිස් ජී. ආර්. ද ලිවේරා විසින් ලියා සහතික කළ 2000 සැප්තැම්බර් 11 දින අංක 3928 ප්‍රසිද්ධ නොතාරිස් ජී. එස්. එන්. රාජකරුණා විසින් ලියා සහතික කළ 2001 මාර්තු 29 දින අංක 890, ප්‍රසිද්ධ නොතාරිස් ජී. සී. ලියනගේ විසින් ලියා සහතික කළ 2001 අගෝස්තු 2 දින අංක 137 සහ ප්‍රසිද්ධ නොතාරිස් ජී. එස්. එන්. රාජකරුණා විසින් ලියා සහතික කළ 2002 සැප්තැම්බර් 11 දින අංක 1603 යන බැඳුම්කර මත බැංකුවට අයවිය යුතුව ඇති මුදල් ගෙවීම පැහැර හැරීමේ හේතුවෙනි)

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2005.05.20 වන දින *රජයේ ගැසට් පත්‍රයද*, 2005.05.03 වන දින ඩේලිනිවිස්, දිනමිණ සහ තිනකරන් පුවත්පත්ද සහ විකුණුම් නිවේදනය සඳහා 2005.07.08 වන දින *රජයේ ගැසට් පත්‍රය* ද බලන්න.

*ගාස්තු ගෙවන පිළිවෙළ* :

1. මිල තීන්දු වූ වහාම ගැනුම් මිලෙන් 10% ක්,
2. ගැනුම් මිලෙන් ඉතිරි 90% වෙන්දේසි දින සිට වැඩ කරන (කාර්යාල) දින 30 ක් ඇතුලත,
3. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) දේශීය අලෙවි බදු,
4. විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාර) වෙන්දේසිකරුගේ කොමිස් මුදල,
5. රු. 33,025.33 නොඉක්මවන සම්පූර්ණ ප්‍රචාරක වියදමින් 50% ක්,
6. ලිපිකරු හා නිවේදක ගාස්තුව රු. 500,
7. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තුව රු. 2000.

හිමිකම් ඔප්පු හා වෙනත් අදාල ලිපිලේඛන කොළඹ 3 ගාලු පාරේ අංක 90 සෙලින්කෝ සෙලාන් ටවර්ස් හි 12 වන මහලේ, සීමාසහිත සෙලාන් බැංකුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති දෙපාර්තමේන්තුව) වෙතින් ලබාගෙන පරීක්ෂාකර බැලිය හැකිය.

දුරකථන 4-701000/2456789

ඩන්ස්ටන් කෙලාට්,
උසාවි කොමසාරිස් සහ බ්‍රෝකර්
විශේෂඥ වෙන්දේසිකරු තක්සේරුකරු
සහ දේපල නියෝජිත.

අංක 381 -1/1ගාලුපාර, කොළඹ 04.
දුරකථන 2591167 දුරකථන/ෆැක්ස් : 2584874, 2500838
ක්ෂණික ඇමතුම් : 0722-250422
07-293

---

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව – නගර ශාඛාව (පිටුබැංකු ඒකකය)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ විකිණීම

### අගනා දේපලක් තොග සහ යන්ත්‍රෝපකරණ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

සීමාසහිත හැටන් නැෂනල් බැංකුව අප වෙත පවරන ලද බලතල ප්‍රකාර පහත සඳහන් තොග සහ යන්ත්‍රෝපකරණ 2005 ජූලි මස 28 වැනි බ්‍රහස්පතින්දා දින පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කය තුළ කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපයේ කර්මාන්ත ශාලා පරිශ්‍රය තුළ සහ එහි ඇති ගබඩා (ගුදම්) සහ පරිශ්‍රතුළ ඇති, (මෙහි ඕන්මතු සියල්ල සාමූහිකව බන්ධනදායීගේ වෙළෙඳ - තොග ලෙස සඳහන් කරනු ලබන) රබර් බූට්ස්, විවිධ ප්‍රමාණවලින් සහ වර්ණවලින් නිෂ්පාදනය වෙමින් පවතින කැන්වස් සපත්තු, සාපත්තු නිෂ්පාදනයේ දී භාවිත කරන කැන්වස් රෙදි වැනි නයිලෝන් රෙදි, ටෙක්සන් ෂීට්, ගොතන ලද රෙදි, සාටක රෙදි, පදම් කළ සම්, රබර් සැකසුම් කිරීමේ රසායන ද්‍රව්‍ය, ලේබල්, ස්ටිකර්, නූල්, ලේස්වර්ග, අයිලට් සහ මුදු වැනි අමුද්‍රව්‍ය සහ ඇතුළත පෙට්ටි ඇතුළුව සපත්තු ඇසුරුම් කිරීම සඳහා භාවිත කරන අමුද්‍රව්‍යද, පිටත ඝන කාඩ්බෝඩ්, ටිෂූ කඩදාසි, පෙට්ටි සඳහා කාඩ්බෝඩ්, ලේබල්, බහුකාර්ය බෑග් සහ සෑම ආකාරයකටම සහ විස්තරයකටම අයත් චංචල දේපල එක්ව සහ වෙන් වෙන්ව සහ බන්ධනදායී විසින් දැන් හෝ මින්මතු යම් කාලයක දී හෝ කලින් කලට, මෙය බලාත්මකව පවතින අතරතුර ඉහත කී දිස්ත්‍රික්කය තුළ බන්ධනදායී විසින් ඔහුගේ වෙළඳ තොග ද, උපකරණ සහ බඩුබාහිරාදිය ද, කවර හෝ ආකාරයක සහ විස්තරයක චංචල දේපල ද, ගෙන යනු ලබන හෝ තබනු ලබන සහ බන්ධනදායී විසින් මින් මතු යම් කාලයක හෝ කලින් කලට ව්‍යාපාරය හෝ කර්මාන්තය ඉවත්කර පවත්වාගෙන යනු ලබන හෝ බන්ධනදායීගේ වෙළඳ–තොග ද බඩුබාහිරාදිය සහ වෙනත් උපකරණ ද ගබඩාකර තබනු ලබන හෝ ස්ථානය හෝ ස්ථාන ද සමග වේ.

පහත දැක්වෙන චංචල දේපල වන යන්ත්‍රෝපකරණ ද සමග වේ :

| *අංකය* | *වර්ගය* | *භාණ්ඩ විස්තරය* | *මොඩිල් අංකය* |
|---|---|---|---|
| 01. | 32 | මිටිසුබිමි තනි ඉඳිකටුවේ මහන මැෂින් | ඩීබී-130ජීජේකේ 10 |
| 02. | 3 | මිටිසුබිමි ඉඳිකටු දෙකේ මහන මැෂිම | ඩීඑන් 260 කේ |
| 03. | 2 | පෙගසස් සිග්-සැග් මහන මැෂිම | ඩීපී එස් 3 |
| 04. | 8 | සීකෝ සිලින්ඩර් ආර්ම් මහන මැෂිම | ටීඑන්6බී |
| 05. | 2 | පෙගසස් ඕවර්ලොක් මහන මැෂිම | ආර්53-01 |
| 06. | 4 | සිංගර් ඉඳිකටු දෙකේ මහන මැෂිම | 212ජී 145 |
| 07. | 1 | පාෂ්ටි බාටැක් මහන මැෂිම | – |
| 08. | | අයිලට් අල්ලන මැෂිම | Tein Taiwan |
| 09. | 4 | 1 එච්.පී. මෝටරයක් සවිකළ සොයින් ආර්ටි හයිඩ්‍රොලික් කටින් මැෂිනර් නිෂ්පාදනය, 1991 | GramuccAtom එස්ටී26 |
| 10. | | 3 එච්පී මෝටරයක් සවිකළ ටොන් 25 බීම් කටින් ප්‍රෙස් | Ting Huiyg |
| 11. | | 2 කිලෝවොට් මෝටරයෙන් සවිකල බිම් කටින් ප්‍රෙස් | Samcostrong- SLS |
| 12. | | හීල් ලාස්ටින් මැෂින් - හෙවි ඩියුටි ටයිප් කිලෝ වොට් 1.5 | කොරියාව |
| 13. | | අවුට්සෝල් ප්‍රෙස් කි.වොා. 1.0 | කේ.ඩී.එච්.9 |
| 14. | | සයිඩ් ප්‍රෙෂ් මැෂින් කි. වොා. 1.0 | කොරියාව |
| 15. | | මෝ ඇන්ඩ් හීල් ප්‍රෙස් | කොරියාව |
| 16. | 2 | සෝල් ප්‍රෙසස් - නියුමැටික් | කොරියාව |
| 17. | 2 | කොම්ප්‍රෙස්ට් එයාර් සිලින්ඩරයක් සහ කකුලෙන් ක්‍රියාකරන වැල්ව් එකක් සවිකල බූට් අන්ලාස්ටික් මැෂින් | – |
| 18. | 15 | වල්කනයිසර් චාටර් සහ 'ට්‍රොලි ටුවින් බේසස්' වලට අවශ්‍ය ද්‍රව්‍ය ලබාදීම සඳහා විශේෂයෙන් සකස් කළ ට්‍රොලි | – |
| 19. | | සපත්තු අඩි සඳහා ගම් යොදන මැෂිම (ග්ලූයින් මැෂින්) | – |

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කය තුළ කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපයේ ඇති පරිශ්‍රය තුළ සහ ඒ මත ඇති (මෙහි ඕන් මතු සියල්ල ඒකරාශීව "බන්ධනදායීගේ චංචල දේපල වන යන්ත්‍රාගාර, යන්ත්‍රෝපකරණ සහ උපකරණ" ලෙස සඳහන් කරනු ලබන) මෙවලම් සහ බඩුබාහිරාදිය ද, කවර ආකාරයක හෝ සෑම විස්තරයකටම අයත් චංචල දේපල වන යන්ත්‍රාගාර සහ යන්ත්‍රෝපකරණ ද, බන්ධනදායී විසින් දැන් හෝ ඕන්මතු යම් කාලයක හෝ කලින් කලට හෝ ඉහත කී දිස්ත්‍රික්කය තුළ ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන හෝ මෙය බලාත්මකව පවතින අතරතුර, බන්ධනදායීගේ චංචල දේපල වන යන්ත්‍රාගාර, යන්ත්‍රෝපකරණ සහ උපකරණ සහ බඩුබාහිරාදිය ගෙනගොස් තබනු ලබන හෝ තබනු ලබන පරිශ්‍ර කෙරෙහි ඒ පරිශ්‍ර පිළිබඳව ද, බන්ධනදායී විසින් මින්මතු යම් කාලයක හෝ කලින් කලට බන්ධනදායීගේ චංචල දේපල වන යන්ත්‍රාගාර, යන්ත්‍රෝපකරණ සහ උපකරණ ඉවත්කොට ගෙන ගොස් තබනු ලබන ස්ථානය හෝ ස්ථාන ද යන මේ සියල්ල සමග වේ.

පහත සඳහන් දේපල සහ යන්ත්‍රෝපකරණ එදිනම පෙ. ව. 11.30 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

පහත සම්පූර්ණයෙන් විස්තර කොට ඇති ඉඩම් කොටස පිළිබඳ කවර ආකාරයේ හෝ වූ පූර්ණ බදු අයිතිය, බූදල් අයිතිය, අයිතිවාසිකම්, හිමිකම් සම්බන්ධතාවය, ප්‍රතිලාභය හිමිකම් පෑම ඉල්ලා සිටීම සමග වේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව සභකාර රජයේ ඒජන්තගේ සීමාව තුළ, මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ සීමාවේ, අලුත්කුරු කෝරලේ දාසිය පත්තුවේ, කටුනායක සිදුව නගර සභා සීමාව තුළ, ඇවරිවත්තේ පිහිටි මහ කොළඹ ආර්ථික කොමිෂන් සභාවේ බල ප්‍රදේශය තුළ කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපයේ 1 වන අදියරේ පිහිටි කදිරානවත්ත නැමැති ඉඩමට බලයලත් මානක සහ තලමිතික එස්. ඒ. එන්. පෙරේරා විසින් මැන සාදන ලද අංක 75/88 සහ 1988 ජූනි මස 03

වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කල ලොට් අංක 28 දරන ඉඩම් කොටස විශාලත්වය අක්කර දෙකයි (ඒ තුළ පිහිටි ගොඩනැගිලි සහ සියළු දේත් සමග වේ.)

පහත දැක්වෙන යන්ත්‍රෝපකරණ එක්ව සහ වෙන්වෙන්ව සමන්විත වේ :

| අංකය | විස්තරය | නිෂ්පාදනය/නිෂ්පාදනය කළ වර්ෂය |
|---|---|---|
| 1. | 175 එච්පී (අශ්වබල 175) මෝටරයක් සහ වේගය අඩු කිරීමේ ගියර් පද්ධතියක්, ලයින් ෂාප්ට්, උණුසුම අඩුකිරීමේ පද්ධතිය සහ ඉලෙක්ට්‍රිකල් ස්විචි ගියර්වලින් පරිපූර්ණ කාස්ට් අයන් රෝලර් සවිකළ 84" × 26" - ඩී.අයි.ඒ. රබර් මිශ්‍රකරන මෝල | Vickers Ruvolt |
| 2. | 100 එච්.පී. (අශ්වබල 100) මෝටරයක් සහ ලුබ්රිකේෂන් ඔයිල් සර්කියුලේෂන් සිස්ටම්, ජලය ශීත කිරීමේ පද්ධතිය, වේගය අඩු කරන ගියර් පද්ධති සහ ඉලෙක්ට්‍රිකල් ස්විචි ගියර් වලින් පරිපූර්ණ කාස්ට් අයන් රෝලර් සවිකළ 60" × 22" ඩීඅයිඒ රබර් මිශ්‍රකරන මෝල | Vickers |
| 3. | නිපොන් 125 එච්පී (අශ්වබල 125) මෝටරයක් සමග ලුබ්රිකේෂන් ඔයිල් සර්කියුලේෂන් සිස්ටම්, ජලය ශීත කිරීමේ පද්ධතිය, වේගය අඩුකරන ගියර් පද්ධතිය සහ ඉලෙක්ට්‍රිකල් ස්විචි ගියර්වලින් පරිපූර්ණ කාස්ට් අයන් රෝලර් සවිකළ 60"× 22" ඩීඅයිඒ - රබර් මිශ්‍ර කිරීමේ මෝල | Nippon |
| 4. | 40 එච්පී (අශ්වබල 40) මෝටරයක් සමග ශීත කිරීමේ පද්ධතිය වේගය අඩු කිරීමේ ගියර් ඒකකය සහ ඉලෙක්ට්‍රිකල් ස්විචි ගියර් වලින් පරිපූර්ණ කාස්ට් අයන් රෝලර් සවිකළ 40" × 16" ඩී. අයි. ඒ. රබර් සීට් සකසන මෝල | Letex |
| 5. | 100 එච්පී (අශ්වබල 100) ඩීසී ඩ්‍රයිවි මෝටරයක් සහ රෝලර් සකස් කිරීම සඳහා නො 7 3 එච්පී මෝටරයක් සවිකළ ලුබ්රිකේෂන් ඩයිල් සිස්ටම් බීවින් සිස්ටම්, වේගය අඩුකිරීමේ ගියර් ඒකකය, විදුලි පාලන පැනලයෙන් පරිපූර්ණ 48"× 18" ඩී අයිඒ පෝ රෝලර් අපර් කැලැන්ඩර් මැෂිම<br>7.5 එච්පී (අශ්වබල 7.5) මෝටරයක් මඟින් ක්‍රියාකරන රෝලර් 8 ජලය ශීත කිරීමේ පද්ධතිය කැලැන්ඩර් මැෂිමේ (cut put) ප්‍රතිදාන සිහිල් කිරීම ද ඇතුළත් ය | Yi Tyung 1991 |
| 6. | 40එච්පී (අශ්වබල 40) ඩී. සී. මෝටරයක් සවිකල ලුබ්රිකේෂන් සිස්ටම්, රෝලර් සඳහා රත් කිරීමේ සහ සිසිල් කිරීමේ පද්ධති, වේගය අඩුකිරීමේ ගියර් ඒකක, විදුලි පාලන පැනලය, රෝලර් 6 අවුට් පුට් ප්‍රොඩක්ට් කලින් කන්වේයර්, විවිධ මෝස්තරවල නො. 3 අමතර රෝලර් සහිත 18" x 8" ඩීඅයිඒ ෂෝ රෝල් බේබි කැලැන්ඩර් මැෂිම | Pussan 1991 |
| 7. | 10 එච්පී (අශ්ව බල10) මෝටරයක් සහ වේගය අඩු කරන ගියර් ඒකකය, 1.5 එච්පී. කලින් කන්වේයර් යන්ත්‍රය සහිත භූමාලයෙන් ජලය රත් කිරීමේ සහ සිසිල් කිරීමේ ක්‍රම සවිකල 22" x 6" ඩීඅයිඒ අවුට්සෝල් කැලැන්ඩර් මැෂිම<br>විවිධ මෝස්තරවල නො. 4 අමතර රෝලර් ද ඇත. | |
| 8. | 7.5 k ය මෝටරයක් සවිකළ 'folling table' සහිත හයිඩ්‍රොලික් බේල් කටරය | |
| 9. | 37 wkwඩීසී මෝටරයක් සවිකළ, වේගය අඩුකිරීමේ ගියර් ඒකකය, රත් කිරීමේ සහ සිසිල් කිරීමේ පද්ධතිය, විදුලි පාලන පැනලය සහ 1 එච්පී (අශ්වබල1) මෝටරයකින් ක්‍රියා කරන කලින් කන්වේයරය සහිත 6" එක්ස්ට්රූඩරය | |
| 10. | 20එච්පී(අශ්වබල 20) ඩීසී මෝටරයක් සවිකළ, වේගය අඩුකිරීමේ ගියර්, රත් කිරීමේ සහ සිසිල් කිරීමේ පද්ධතිය සහිත 4 1/2" එක්ට්ස්රූඩරය | |
| 11. | 12.5 ඩීසී මෝටරය සවිකළ වේගය අඩුකිරීමේ ගියර් ඒකකය, රත් කිරීමේ සහ සිසිල් කිරීමේ ඒකකය සහ විදුලි පාලන පැනලය සහිත 1/2 එක්ස්ට්රූඩරය | |
| 12. | 30 එච්පී (අශ්වබල 30) මෝටරයක් සවිකළ, නො. 3 ඇකියුමිලේටර් සහ මුද්‍රණාලවලට පීඩනයක් යටතේ ජලය සැපයීමට අවශ්‍ය ජල නල පද්ධතිය සහිත හයිඩ්‍රොලික් පොම්පය | |
| 13 | ජල පීඩන පද්ධතිය යටතේ සූදානම්ව තබා ඇති පොම්පය ලෙස භාවිතා කරන 11kw ලිමි මෝටරයක් සවිකළ හයිඩ්‍රොලික් පොම්පය | |
| 14. | 10එච්පී (අශ්ව බල 10) මෝටරයක් සවිකළ මුද්‍රණාලවලට පීඩනයක් යටතේ ජලය ලබා දෙන 'ලෝ ප්‍රෙෂර් මල්ටි ස්ටේජ් සෙන්ට්‍රිෆුවල් ' පොම්පය | |
| 15. | ප්ලැටන දෙකක් සහිත ජල පීඩන පද්ධතියෙන් ක්‍රියා කරන, භූමාලයෙන් රත් කිරීමේ ක්‍රමය සහ වේලාව සටහන් කරන උපකරණයකින් යුක්ත පැස්සුම් මුද්‍රණ යන්ත්‍ර 14 (ප්‍රමාණය 22" × 22" 27.5, 22 × 20 පැස්සුම් පීඩන යන්ත්‍ර 14) | |
| 16. | භූමාලයෙන් රත් කරන නල පද්ධතියක් සහිත, ප්ලැටන එකක් ඇති 16" x 18" නියුමටික් පැස්සුම් මුද්‍රණ යන්ත්‍රය | |
| 17. | හයිඩ්‍රොලික් ඔයිල් වලින් ක්‍රියාකරන ලද විදුලි බලයෙන් රත්වන 24" x 24" සහ 20" x 20" ප්‍රමාණයේ ප්ලැටන සහිත ජල බලයෙන් තනි ඒකකයන් ලෙස ක්‍රියා කරන යන්ත්‍ර 2 | |
| 18. | අධි පීඩන ජල පද්ධතියක් මඟින් උපදවන භූමාලයෙන් රත්වන 30" x 30" ප්‍රමාණයේ කි. වො. 500 පැස්සුම් යන්ත්‍රය | |
| 19. | 3 එච්පී (අශ්වවල 3) මෝටරයක් සවිකළ, නො. 2, රෝද සහ බුෂ් සහිත 'අවුට්සෝල්' ග්‍රයින්ඩින් මැෂිම | |
| 20. | 2 එච්පී (අශ්වබල 2) මෝටරයක් සවිකළ අවුට් සෝල් ග්‍රයින්ඩින් මැෂිමට සම්බන්ධ දුහුවිලි එකතු කරණය | |
| 21. | දුහුවිලි එකතුකරණයක් සහිත ඊවා සෝල් වෙජ් බ්ෂ්න් මැෂිම | |
| 22. | දුහුවිලි එකතු කරණයක් සහිත ඊවා සෝල් වෙජ් බ්ෂ්න් මැෂිම | |
| 23. | කිලොවොට් 3.7 මෝටරයක් සවිකළ, වේගය අඩු කිරීමේ ඒකකය සහ සිසිල් කිරීමේ ඒකකය සහිත ග්ලූ මික්සර් යන්ත්‍ර 2 | |
| 24. | කැන්වස් ෂූස් ඇසෙම්බ්ලි කන්වේයරය ඉන්පුට් හීඩින් කන්වේයරය සහ ස්ටීම් හීටර් චැම්පර් ද, විවිධ වේග ධාවන, අ. 5 කේබේ. ගියර් මෝටරය, රබර් බෙල්ට් සහිත අඩි 60 ක් දිග වේන් අසෙම්බ්ලි කන්වේයරය සහිතය. 50 දෙනෙකුට එක්වර දෙපස සිට වැඩකළ හැක. මේන් කන්වේයරයේ උපකොටසේ අඩක් නිමකළ සපත්තු එල්ලා තැබීමට කොකු සහිත වේලීමේ ඒකකයන් ඇත. | |
| 25. | රබර් බෙල්ට් කන්වේයරය සහිත විවිධ වේගයේ ගියර් සහිත කිලෝවොට් 1 ක මෝටරයකින් ක්‍රියාකරන බූට් ඇසෙම්බ්ලි ලයින් දිග අඩි 60- එකවර 40 දෙනෙකුට දෙපස සිට වැඩෙහි යෙදිය හැක. | |
| 26. | 2 එම් x 5 එම් ප්‍රමාණයේ පීඩිත වායු සැපයුමක් Conderate dorins සහ උෂ්ණත්ව පාලකයක් සහිත විශේෂයෙන් නිර්මාණය කරන ලද ප්‍රෙෂර් වෙසල් ස්ටීම් වෝල්කනයිසර් වේම්බරය | |
| 27. | පීඩිත වායු සැපයුමක් සහ භූමාලය සැපයුමක් සහිත 3" x 11" ප්‍රමාණයේ, ප්‍රෙෂර් වෙසල් ස්ටීම් වොල්කනයිසර් චෙම්බරය | |
| 28. | ඔටෝමැටික් ස්ටීම් බොයිලේරුව - ගින්දර නල -3 ධාරිතාව ටොන් 2/එච්R ක්‍රියාකාරී පීඩනය 5 කේජී/2සීඑම්, බ්ලෝවරය, ජල පොම්පය ඉන්ධන පොම්පය, ද්‍රව්‍යවන ටැංකිය, ලීටර් 40,000 ක ඉන්ධන හා තෙල් ගබඩා කරන ටැංකියෙන් සමන්විතය. | Tongli korea 1991 |
| 29. | 800 කේජී/එච්ආර් ධාරිතාවක් ඇති, බ්ලෝවරය සහ වෙනත් අදාළ උපකරණ සහිත වෝටර් ටියුබ් වර්ටිකල් බොයිලර් | Steamax |
| 30. | කි. වො. 32 මෝටරයක් සවිකළ, එයාර් කොම්ප්‍රෙෂර් යන්ත්‍රය, එයාර් රිසීවර් සහ කම්ප්‍රෙස්ඩ් එයාර් සිස්ටම් සහිතය. | Ingersoll Rand MLBO |
| 31. | කර්මාන්ත ශාලාවේ ජල සැපයුම් සහ සිසිල් කිරීමේ පද්ධතිය -D4, ජල පොම්ප 2 සිසිල් කිරීම අඩු කරන උපකරණය, බෙදාහැරීමේ ජල නල පද්ධති, ජල නල පද්ධති ආදියෙන් සමන්විත වේ. | |

ඉහත සඳහන් බඩු තොග වංචල යන්ත්‍රෝපකරණ සහ දේපල ප්ලීමත් ඉන්ඩස්ට්‍රිස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු හැටියට සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට උකස් කොට ඇත.

*ගෙවීමේ ක්‍රමය* :- මිල තීන්දු වනවාත් සමග, සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් අගයන් මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් 10%,
2. ගැණුම් මිලෙන් ඉතිරි 90% වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතුය,
3. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක් වන පළාත් අධිකාරි බද්ද,
4. විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්) වන වෙන්දේසිකරුගේ කොමිස් මුදල,
5. රු. 100,000 නොඉක්මවන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැයෙන් 50%,
6. ලිපිකරුගේ සහ සෝෂකගේ ගාස්තුව රු. 500,
7. විකුණුම් කොන්දේසි සඳහා නොමාරිස් ගාස්තුව රු. 2,000.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා කරුණාකර 2005.05.03 වන දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් යන පුවත්පත් ද 2005.04.21 වන දින රජයේ ගැසට් පත්‍රයද බලන්න.

කොළඹ10, ටී. බී. ජයා මාවතේ, අංක 479 හි සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ ප්‍රධාන කළමණාකරු නීති (ආපසු අයකර ගැනීම්) වෙතින් (දුරකථන අංක. 661815) වැඩිදුර ලබාගැනීමත් නිමිකම් ඔප්පු හා වෙනත් අදාල ලිපි ලේඛන පරීක්ෂාකර බැලීම හා ලබා ගැනීම සිදුකළ හැකිය.

ෂොක්මන් සහ සමරවික්‍රම,
ශ්‍රී ලංකාවේ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ බැංකු සඳහා
පිළිගත් පුරෝගාමී වරලත් වෙන්දේසිකරුවෝ සහ තක්සේරුකරුවෝ
සහ උසාවි කොමසාරිස්වරු.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර
දුරකථන අංක : 081-2227593
දුරකථන/ෆැක්ස් : 081-2224371

*නාගරික කාර්යාලය :*
අංක. 55 ඒ ධර්මපාල මාවත,
කොළඹ.
දුරකථන අංකය :2441761
දුරකථන අංකය ෆැක්ස් : 2448526
E-mail: samera@sri.lanka.net

07-238

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමිය විසින් කරන ලද පත්කිරීම් ආදිය

2005 අංක 271

**ශ්‍රී ලංකා නාවික හමුදාව – ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමිය විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

2005 ජූනි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා නාවික හමුදා ස්ථිර බලකායේ පහත නම සඳහන් නිලධාරිනියගේ අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපතිතුමිය විසින් අනුමත කර ඇත.

වෛද්‍ය ලුතිනන් (දන්ත) රත්නායක මුදියන්සේලාගේ චාර්ෂිකා කුමාරි රත්නායක, ශ්‍රීලංනාහ
අතිගරු ජනාධිපතිතුමියගේ අණපරිදි,

මේජර් ජනරාල් අශෝක කේ. ජයවර්ධන
ආර්ඩබ්ලිපී. ආර්එස්පී, වීඑස්වී, යූඑස්පී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2005 මැයි මස 11 වැනි දින,
කොළඹ.
07-260

2005 අංක 272

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්වේච්ඡා බලකාය**

අතිගරු ජනාධිපතිතුමිය විසින් අනුමත කරන ලද ස්වේච්ඡා නාවික උප සේවයට මාරු කිරීමක්

පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා නාවික හමුදා ස්වේච්ඡා බලකායේ සිට 2005 අප්‍රේල් මස 07 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ස්වේච්ඡා නාවික උප සේවයට මාරු කිරීම අතිගරු ජනාධිපතිතුමිය විසින් අනුමත කර ඇත.

කොමාන්ඩර් (ස්වේ) ලොකු අතුරුගිරි ආරච්චිගේ ආනන්ද චන්ද්‍රසිරි අමරසිංහ, ශ්‍රීලංනාහ
අතිගරු ජනාධිපතිතුමියගේ අණ පරිදි,

මේජර් ජෙනරාල් අශෝක කේ. ජයවර්ධන,
ආර්ඩබ්ලිපී, ආර්එස්පී, වීඑස්වී, යූඑස්පී
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2005 මැයි මස 11 වැනි දින,
කොළඹ දී ය.
07–259

## වෙනත් පත්කිරීම් ආදිය

**ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පත්කිරීම්**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I පන්තියේ එම්. වී. බන්දුසේන මහත්මිය 2003.11.03 දින සිට නැවත නියමයක් කරන තුරු කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (ගොවිජන සංවර්ධන) වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I පන්තියේ ආර්. එස්. එම්. වී. සෙනෙවිරත්න මහත්මිය 2004.03.22 දින සිට නැවත නියමයක් කරන තුරු රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂවරියක් වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I පන්තියේ එන්. ආර්. අතුකෝරල මහත්මිය 2004.03.22 දින සිට නැවත නියමයක් කරන තුරු රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂවරියක් වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II/I ශ්‍රේණියේ ඩබ්. එම්. ඩී. ප්‍රනාන්දු මහත්මිය 2004.08.16 දින සිට නැවත නියමයක් කරන තෙක් රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ඒකාබද්ධ සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂවරියක් වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II/I ශ්‍රේණියේ නිළධාරිනී එන්. එන්. සී. කේ. බණ්ඩාර මහත්මිය 2005.03.07 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරන තුරු කාන්තා අභිවෘද්ධි හා සමාජ සුභසාධන අමාත්‍යාංශය යටතේ ඇති ළමා ලේකම් කාර්යාලයට උඩඩලන අධ්‍යක්ෂ වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II /II පන්තියේ ආර්. එම්. පී. එස්. රත්නායක මහතා 2003.11.11 දින සිට නැවත නියමයක් කරනතුරු කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ ඇති ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I /II ශ්‍රේණියේ එන්. නිල්වල මහතා 2004.07.15 දින සිට නැවත නියමයක් කරන තෙක් රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ රාජ්‍ය සේවා පුහුණු ආයතනයේ සහකාර අධ්‍යක්ෂ වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II/II ශ්‍රේණියේ කේ. එම්. බී. ටී. කරුණසේන මහත්මිය 2004.09.01 දින සිට නැවත නියමයක් කරන තෙක් රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරියක් වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II/II ශ්‍රේණියේ එස්. අවන්ති මද්දුමාගේ මහත්මිය 2004.09.01 දින සිට නැවත නියමයක් කරන තෙක් රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ සහකාර ආයතන අධ්‍යක්ෂවරියක් වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II/II ශ්‍රේණියේ ජේ. ජයසුන්දර මහතා 2004.09.01 දින සිට නැවත නියමයක් කරන තෙක් රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරියෙක් වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II/II ශ්‍රේණියේ එම්. එම්. කිශාන්ති මෙනවිය 2004.09.01 දින සිට නැවත නියමයක් කරන තෙක් රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ එකාබද්ධ සේවා සහකාර අධ්‍යක්ෂවරියක් වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II/II ශ්‍රේණියේ එස්. පී. කේ. බෝධිමාන්න මහත්මිය 2004.09.01 දින සිට නැවත නියමයක් කරන තෙක් රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරියක් වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II/II ශ්‍රේණියේ ඒ. ඒ. අයි. කේ. අමරසිංහ මහත්මිය 2004.09.01 දින සිට නැවත නියමයක් කරන තෙක් රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරියක් වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II/II ශ්‍රේණියේ එල්. ඒ. ජී. කේ. ජයසිංහ මහත්මිය 2004.09.01 දින සිට නැවත නියමයක් කරන තෙක් රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරියක් වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II/II පන්තියේ ජී. එල්. පී. පෙරේරා මහත්මිය 2004.09.06 දින සිට කෘෂිකර්ම, පශු සම්පත් ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ සහකාර ලේකම් (පාලන) වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II/II පන්තියේ ඩී. එම්. කේ. සී. දිසානායක මහතා 2004.09.06 දින සිට නැවත නියමයක් කරන තුරු කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ සහකාර ලේකම් (පාලන) වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II/II ශ්‍රේණියේ ජේ. එස්. පී. පියසේන මහතා 2004.09.09 දින සිට නැවත නියමයක් කරන තෙක් රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ඒකාබද්ධ සේවා සහකාර අධ්‍යක්ෂ වරයෙක් වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II/II පන්තියේ ජී. කේ. ඩී. එස්. ගුණසේකර මහත්මිය 2004.09.09 දින සිට කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ සහකාර ලේකම් (කෘෂිකර්ම සංවර්ධන) වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II/II ශ්‍රේණියේ පී. එල්. සත්මකුමාර මහතා 2004.09.22 දින සිට නැවත නියමයක් කරනතෙක් රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ සහකාර ආයතන අධ්‍යක්ෂවරියෙක් වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II/II ශ්‍රේණියේ එම්. ඩබ්. එස්. පී. කරුණාරත්න මහත්මිය 2004.09.29 දින සිට කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ සහකාර ලේකම් වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II/II පන්තියේ නිලධාරිනී ඩී. ජී. පී. අයි. අමරසිංහ මහත්මිය 2005.01.10 දින සිට ක්‍රියාත්මන වන පරිදි නැවත නියමයක් කරන තුරු කාන්තා අභිවෘද්ධි හා සමාජ සුභසාධන අමාත්‍යාංශය යටතේ ඇති ආබාධ සහිත පුද්ගලයින් සඳහා වූ මහ ලේකම් කාර්යාලයට සහකාර ලේකම් වශයෙන්.

ඩී. දිසානායක,
ලේකම්,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2005 ජූනි මස,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
ටොරින්ටන් චතුරස්‍රය,
කොළඹ 07.
07-235

# ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී.බී.11/2002.

**1994 අංක 7 ගාලු උරුමය පඳනම පනත**

1994 අංක7 දරන ගාලු උරුමය පදනම පනතේ 8 වන වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 20 වන වගන්තිය යටතේ සංස්කෘතික හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

සංස්කෘතික හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍ය.

2005 ජූනි මස 14 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

01. මේ නියෝග 2004 අංක 01 දරන ගාලු උරුමය පදනම (කාර්ය මණ්ඩල) නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර,එම නියෝග 2005. 06. 14 දින සිට බලාත්මක විය යුතුය.

